**සබරගමුව පළාත් සභාව**

**சபரகமுவ மாகாண சபை**

**SABARAGAMUWA PROVINCIAL COUNCIL**

***2017 අප්‍රේල් මස 04 අඟහරුවාදා දින***

***2017 ஏப்ரல் மாதம் 04 ஆம் திகதி செவ்வாயக்கிழமை***

***Tuesday 04 th April 2017***

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

සියළුදෙනාටම සුභ උදෑසනක් වේවා ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඒ වගේම ගරු අමාත්‍යතුමන්ලා, ඒ වගේම ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියළුම මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. අද දිනට න්‍යාය පත්‍රානුකූලව මෙම ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පළමුවෙන්ම තිබෙන්නේ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම්දීම් : නැත**

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ : නැත**

**ගරු සභාපතිතුමාගේ නිවේදන :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

සබරගමුව පළාත් සභා ගරු මන්ත්‍රීතුමන්ලාගේ වාහනය පහසුවෙන් හඳුනා ගැනීම සඳහා වාහනය ඉදිරිපස ප්‍රදර්ශණය කිරීමට වාහනය ඉදිරිපිට ලුමිනස් වර්ණයෙන් මුද්‍රිත අවසර පත්‍රයක් සකස් කර දෙන ලෙස වැඩ කටයුතු කාරක සභා ගණනාවකදීම ඉල්ලීම් කරනු ලැබුවා. ඒ අනුව ඒ අවසර පත්‍රය සකස් කරලා තියනවා. එය අද ඔබතුමන්ලා සියළුදෙනාටම ලැබෙන්නට සළස්වනවා කියන පණිවිඩය තමුන්නාන්සේලාට දැනුම් දෙනවා.

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

ගරු අමාත්‍ය ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමා.
ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා.
ගරු ආණ්ඩුපක්ෂ සංවිධායක හර්ෂ සියඹලාපිටිය මැතිතුමා.
ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.
ගරු මන්ත්‍රිනී වත්සලා පද්මසිරි මැතිතුමිය.
ගරු මන්ත්‍රී පී.අබේනායක මැතිතුමා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

එම නම් ඉදිරිපත් කරන ලද ගරු මැති ඇමතිතුමන්ලා සඳහා සභාවේ නිවාඩු අනුමත වෙනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------------

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යටිපහුව, පාන් කඩේ ලඟ පාළම අසළ පැති බැම්ම ඉදිකිරීම යන ලිපියට පිළිතුරු ලැබී තිබෙනවා. එය අපි සභාගත කරනවා.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම් : නැත**

**පෙත්සම් :**

***ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න***
***கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன***
*Hon.Member Salitha Karunaratne*
**------------------------------------------------------**

ගරු සභාපතිතුමනි, මා විසින් 2017.01.10 වෙනි දින ඉදිරිපත් කරන ලද පෙත්සමට අදාළ කරුණු කීපයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ඉල්ලා සිටිනවා. විශේෂයෙන් උඩුමත්ත, ඇහැළියගොඩ ආර්.ඒ.සිසිර කුමාර කියන හිටපු විදුහල්පතිවරයෙකුගේ විශ්‍රාම ගැන්වීම පිළිබඳ පෙත්සමක් මම මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඒ අනුව පෙත්සම වැඩ කටයුතු කාරක සභාවට ඉදිරිපත් කරලා තියනවා. ඒ අනුව 02.17 වෙනි දින න්‍යාය පත්‍රයට ඉදිරිපත් කිරීමට සුදුසු බව නිර්දේශ කරලා තිබෙනවා. ඒ එක්කම ගරු සභාපතිතුමනි, පෙත්සම් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පටිපාටිය අනුව අදාළ ආයතනයෙන් කරුණු විමසීම් කරලා, ලැබෙන පිළිතුරත් එක්ක පෙත්සම, පෙත්සම් කාරක සභාවට ගන්නවාද ? නැද්ද ? කියන තීරණයක් ඇවිල්ලා තියනවා. ඒ අනුව ඉහත කරුණට අදාළව ඔබතුමා විසින් එවන ලද පෙත්සම සබරගමුව පළාත් සභා මහජන පෙත්සම් කාරක සභාව තුළ විමර්ශණය කිරීමට හැකියාවක් නොමැති බව දන්වලා තියනවා. ගරු සභාපතිතුමනි, දැන් ඒ දැනුම් දීම පිළිබඳ කාරණාවක් නෙමෙයි. දැන් මේ එහෙම දැනුම් දෙන්නෙ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2017.02.22 දරණ ලිපිය. එතකොට ඇත්තටම ඒ ලිපියේ කියන කරුණු නිවැරදි නම්, මේක තීන්දු කරනවා නම් මහජන පෙත්සම් කාරක සභාවට ගන්න බෑ කියලා අපි එකඟයි. ගරු සභාපතිතුමනි, හැබැයි මේ ලියුම තර්කානුකූල සහ නෛතික මූලාශ්‍රවලින් තොර ලිපියක්. ඒ හින්දා ගරු සභාපතිතුමනි, මට අවසර දෙන්න මේ ලිපියේ තියනවා, ඒ කියන්නේ ගරු සභාපතිතුමනි, මෙම විදුහල්පතිවරයා විදුහල්පති සේවයේ නිළධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, සේවයේ ස්ථිර කිරීම් විශ්‍රාම ගැන්වීම් ආදී කටයුතු සිදුකිරීමේ බලය රේඛීය අමාත්‍යාංශය සතුයි. ඒ හින්දා පළාත් පාසලක විදුහල්පතිවරයෙක් විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් අපට සාකච්ඡා කරන්න බෑ කියලා. නමුත් ගරු සභාපතිතුමනි, ඉතා පැහැදිලිව ගැසට් පත්‍රයේ 17/3351 දරණ 2011.11.25 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් විදුහල්පතිවරුන් ගැන බලතල පැවරී තිබෙන බව සඳහන්. එහි සඳහන් වෙන්නේ 7 ඒ ඡේදය යටතේ ජාතික පාසැල්වල විදුහල්පතිවරු ගැන විතරයි. එතකොට එහි කොහේවත් කියවෙන්නේ

නෑ පළාත් සභා විදුහල්පතිවරුන්ගේ බලය රේඛීය අමාත්‍යාංශයට තියනවා කියලා. එහෙම නම් ගරු සභාපතිතුමනි, ඉතා පැහැදිලිව කියන්නේ මේක පළාත් සභාව සතු කාර්යයක්. ඒ හින්දා අමාත්‍යාංශ ලේකම්වරයා මේ දැනුම් දෙන දැනුම් දීම පදනම් විරහිතයි. එක වෙලාවක කියනවා ගරු සභාපතිතුමනි, මේ විදුහල්පතිවරයා ස්ථිර සේවකයෙක් නෙමෙයි කියලා. ස්ථිර සේවකයෙක් නෙමෙයි කියලා කියන්න බෑ සභාපතිතුමනි, එකක් තමයි යම් රජයේ සේවකයෙක් පරිවාස කාලයෙන් පස්සේ ස්ථිර කිරීමේ වගකීම තියෙන්නේ ආයතන ප්‍රධානියාට. අවුරුදු තුනක් ගියාට පස්සේ. එහෙම නැත්නම් ඒ අදාළ සේවකයාගේ නෙමෙයි. දෙවෙනි කාරණාව තමයි මෙයා ස්ථිර සේවකයෙක් නෙමෙයි කියලා ඔප්පු කරන්න පුළුවන් කාරණාව තමයි මෙයා විදුහල්පති විභාගයට පෙනී ඉන්නවා. විදුහල්පති විභාගයට පෙනී ඉන්නේ ස්ථිර සේවකයෙක් නම් තමයි. එහෙම නැත්නම් පෙනී හිටින්න බෑ. ඒ හින්දා ගරු සභාපතිතුමනි, ඉතා පැහැදිලිව මම කරුණු සනාථ කරන්නේ මේ කාරණාව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපිය තර්කානුකූල නෑ. මූලාශ්‍රගත නෑ. ඒ හින්දා මේක මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරන්න. විමර්ශණය කරන්න. විමර්ශණයේ දී ප්‍රතික්ෂේප වෙනවා නම් අපි වැඩේ අත අරිමු. ඒ හින්දා ගරු සභාපතිතුමනි, මේක මහජන පෙත්සම් කාරක සභාවේ කාරණාවක් විදිහට සළකන්න සහ අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා මේ කාරණාව පිළිබඳව මහජන පෙත්සම් කාරක සභාවට කරුණු ඉදිරිපත් කිරීමේ දී මොහුට සහයට කවුරු හරි ඕන නම් කරුණු ඉදිරිපත් කරන්න ඉඩ දෙන්නත් කියලා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි ! ගරු සභාපතිතුමනි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද පෙත්සමට අදාළව ලැබී ඇති පිළිතුරත් පිළිබඳව ඔබතුමා මා එක්ක පෞද්ගලිකවත් කථා කළා. ඒ නිසා යම් ගැටළුවක් හෝ අපහසුතාවයකට පත් වෙලා තියනවා නම් ඒක නිවැරදි කිරීමටත්, ඒ පිළිබඳව නැවත සොයා බලා නීත්‍යානුකූලව අවශ්‍ය පියවර ගන්න බව ඔබතුමාට අපි දැනුම් දෙනවා.

**ප්‍රශ්න : නැත**

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

මේ යටතේ ගරු ප්‍රධාන ඇමතිතුමාට අවස්ථාව.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*

**------------------------------------------**

ගරු සභාපතිතුමනි, අපේ ගරු සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ වරප්‍රසාද සම්බන්ධයෙන් ගැටළුවක්, ප්‍රශ්නයක් ඇති වුන වෙලාවේ විශේෂයෙන්ම අපේ ගරු ආණ්ඩුකාරතුමා ජනතාවගේ ප්‍රශ්නයක් ලෙස ඊට සවන් දීලා ඒ සම්බන්ධයෙන්

අපට ඉතාම ඉහළින් සහයෝගය, අනුග්‍රහය දැක්වීම සම්බන්ධයෙන් ගරු සභාව වෙනුවෙන් මම ගරු ආණ්ඩුකාරතුමාට මේ අවස්ථාවේ දී අපගේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. මම හිතන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ප්‍රකාශ කරන්න යෙදුන, ගරු ආණ්ඩුකාරතුමා වෙනුවෙන් කරන ලද ස්තුතිය සම්බන්ධයෙන් මම හිතන්නේ පක්ෂ විපක්ෂ සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් වෙලා ඉන්නවා. ඒ නිසා එතුමාට අපි ස්තුතිවන්ත වෙනවා ගරු ආණ්ඩුකාරතුමා වෙනුවෙන් ස්තුතිය පළ කිරීම පිළිබඳව.

**පෞද්ගලික ප්‍රකාශ කිරීම් :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------------

ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්*
*கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்* *Hon.Member Nihal Farook* -

--------------------------------------------

ගරු සභාපතිතුමනි, පෞද්ගලික ප්‍රකාශ යටතේ විශේෂයෙන්ම පහුගිය 02 වෙනිදා මට පෞද්ගලිකව අපහසුතාවයට පත් වෙන කාරණාවක් සිද්ධ වුනා. මම පළාත් සභාවට පත් වෙලා වසර 14 ක්, 15 ක් වගේ කාලයක් වෙනවා. කරවනැල්ල මූලික රෝහලේ රෝගියෙක් බලන්න ගිය අවස්ථාවේ එදා ඇත්තටම මගේ රියදුරු මහත්මයා එදා හිටියේ නෑ. නිවාඩු ගිහිල්ලා හිටියේ අසනීප වෙලා. මම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු දෙන්නෙක් එක්ක තමයි රෝහලට ගියේ ඒ රෝගියා බලන්න. ඒ අවස්ථාවේ දී රෝහල් ආරක්ෂක කණ්ඩායම, සිකියුරිටි එකෙන් මට වාහනය එතන පාක් කරලා ඇතුළට යන්න ලබාදුන්නේ නෑ අවස්ථාව. විශේෂයෙන්ම මම ඉල්ලුවේ විනාඩි 5 කින් මම එනවා. මම පළාත් සභා මන්ත්‍රීවරයෙක්. මේක මේ පළාතේ මේ ආසනයේ තියන රෝහලක්. ඉතින් මට මහජන නියෝජිතයෙක් හැටියට පළාත් සභාවේ රෝහලකට ගිහිල්ලා තමන්ගේ වාහනය අනෙක් කාර්යය මණ්ඩයට හෝ වෛද්‍යවරුන්ට කිසිම අපහසුතාවයක් නොවෙන විදිහට වාහනය පාක් කරලා ගිහිල්ලා රෝගියෙක් බලන්න යන්න බැරි තත්ත්වයක් තියනවා නම් මේක මම හිතන්නේ පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපට අගෞරවයක් කියලා මම විශ්වාස කරනවා. පුද්ගලිකව නිහාල් කියන චරිතයට නෙමෙයි අපි මහජන නියෝජිතයින් හැටියට 44 දෙනාම එකවර එක රෝහලට ගිහිල්ලා කවුරුවත් බලන්න යන්නේ නෑ. හදිසි අවස්ථාවක දී අපගේ කවුරු හරි ලෙඩෙක් බලන්න යනවා නම් අපි ඇත්තටම මේ දේශපාලනය නැත්නම් මන්ත්‍රීකම අයුතු ලෙස පාවිච්චි කරන උදවිය නෙමෙයි. ඇත්තටම එදා රියදුරු මහත්මයෙක් හිටියා නම් මම වාහනය ඇතුළට දාලා එතන පාක් කරන්නෙත් නෑ. එළියට තමයි ගේන්නේ. නමුත් රියදුරු කෙනෙක් නැති හින්දාම තමයි මම ඒ අවස්ථාවේ දී වෛද්‍යවරු ගාල් කරන තැන නෙමෙයි වාහනය නැවැත්වුවේ. ඊට

පල්ලෙහා ඉඩ තියන හරියක තමයි නවත්වලා ගියේ. ඉතින් ඒ පිළිබඳව මම විනාඩි 5 න් එනවා කියලා වාහනය නවත්වලා ගියා. ගිහිල්ලා විනාඩි 5 න් මම ආවා. විනාඩි 5 ක් ගියෙත් නෑ. ඒ අතරතුර එතන ඉන්න පොලිස් පෝස්ට් එකෙනුත් එක්කෙනෙක් ගෙනල්ලා මට තර්ජනාත්මකව කථා කළා. ඉතින් ඒ පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා කරවනැල්ල මූලික රෝහලේ පරිපාලනය සම්බන්ධයෙන් වහාම මේ මන්ත්‍රීවරුන්ට වෙන අසාධාරණය පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද කාරණාව පිළිබඳව, ඔබතුමා පත් වෙච්ච අපහසුතාවය පිළිබඳව අපි ඉතාම කණගාටු වෙනවා. ඒ පිළිබඳව ඔබතුමා විසින් කරන ලද කාරණාව පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා අදාළ අවශ්‍ය පරීක්ෂණ පවත්වලා ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කිරීමට කටයුතු කරන බව දැනුම් දෙනවා.

***ගරු මන්ත්‍රී අජිත් ශාමින්ද***
***கௌரவ உறுப்பினர் அஜித் ஷாமிந்த***
*Hon.Member Ajith Shyaminda*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම මතක් කරන්න හැදුවේ එවැනිම කාරණාවක් මටත් සිද්ධ වුනා. කරවනැල්ල රෝහලට මම පෙරෙයිදා ගිහාම පෞද්ගලික ආරක්ෂක අංශයෙන්, පළාත් සභා මන්ත්‍රී විදිහට මම, රියදුරු හිටියා. රියදුරුට තර්ජනය කරලා තියනවා පහළින් දාන්න කියලා. එතන ඉඩකුත් තියනවා. මම කිව්වා ඇම්බියුලන්ස් එකක් ආවොත් ගන්නම්. පැය ගාණක් ඉන්නේ නෑ කියලා. ගරු සභාපතිතුමනි, මමත් ඉල්ලා සිටින්නේ මේ පළාත් සභාවේ ආයතනවල අඩුගානේ ඒගොල්ලන්ගෙවත් ගරු කිරීමක් තියෙන්න ඕන පළාත් සභා මන්ත්‍රීවරයෙක් ගිහාම. ඒ නිසා ඔබතුමා මේ පිළිබඳ තදින් අවවාදාත්මකම ආයෙත් මේ වගේ දෙයක් නොවෙන විදිහට අවශ්‍ය කටයුතු හෝ චක්‍රලේඛයක් ඒ අමාත්‍යාංශය හරහා හෝ යවන්න කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! අජිත් ශ්‍යාමින්ද මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා දෙපළම එකම කරුණ ඉදිරිපත් කළේ. ඒ පිළිබඳව කඩිනමින් ඒ අවශ්‍ය කටයුතු කරන්න කටයුතු කරන බව දැනුම් දෙමින්, මීළඟට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේටත් මේ ආරාධනාව තිබුණා ගරු සභාපතිතුමනි. බොරළුව පන්සලේ දහම් පාසැල් උත්සවය වෙලාවේ, දහම් පාසැල් උත්සවයට සහභාගී වීමට ප්‍රථම ප්‍රභූවරු පිරිසක් වට කරගෙන කිව්වා මේ මනංඇල්ල ප්‍රදේශයේ කුඩු ජාවාරම්කාරයෝ ඉන්නවා. බෝතල් ගෙනල්ලා බීලා, පාර හරහා විනාශ කරලා බෝතල් කඩු දාලා විනාශ කරලා තියනවා. මේක අපේ ජනතාව බේරා ගන්න කොහොම හරි පොලීසියට ගිහිල්ලා දැනුවත් කරලා මේ කටයුත්ත කරන්න කියලා. ඒ අනුව එම රැස්වීමේ දී ජනතාව දැනුවත් කරන වෙලාවේ පොලීසියට කිව්වා මනංඇල්ලේ මෙහෙම දෙයක් තියනවා නම් වහාම තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්න කියලා. ඒ අනුව කිරිඇල්ල, ඇහැළියගොඩ පොලීසි දෙකෙන්ම ගිහිල්ලා මේ ගැන විමර්ශණයක් කරලා මම හිතන්නේ කීප දෙනෙක් අල්ලා ගත්තා. මෙතනදී කුඩු විකුණන පුද්ගලයාත් අහුවෙලා කොහොම හරි ලිස්සලා පැනලා ගිහිල්ලා තියනවා. මේ අවස්ථාවේ ඉඳලා ගරු සභාපතිතුමනි, ඊයේ එළිවෙන තෙක්ම ගත්තාම විවිධාකාරයේ තර්ජන තියනවා. මම ඉන්න දූව කියන කාර්යාලය තියන ගොඩනැගිල්ලට රෑ 1.00 ට විතර පුද්ගලයෝ දෙන්නෙක් ඇවිල්ලා කිව්වා පරිස්සම් වෙනවා කියලා. ඊට පස්සේ අපි පන්නනකොට මොහු ගිහිල්ලා වාහනයක නැගලා යන්න ගියා. අපට ඒ දුවන විදිහත් එක්ක අල්ලා ගන්න බැරි වුනා. ඉතින් මේක මේ තර්ජනය ගරු සභාපතිතුමනි, අති විශාල ආකාරයට පහුගිය කාලයේ තිබුණා. මේ තර්ජනය තිබුණත් එවකට මගේ හිතේ මේ ගරු සභාවේම ආරක්ෂාව ඉල්ලලා තියනවා මම 19 වතාවක්. මට ඒක ලැබුනේ නෑ. පසුව 2015 න් පස්සේ මට ආරක්ෂාව දෙනකොට ගරු සභාපතිතුමනි, මම ගත්තේ නෑ. මට තර්ජනයක් නෑ. ප්‍රශ්නයක් නෑ කියලා හිටියා. නමුත් දැන් මේ වෙලාවේ තියන තර්ජනය ගත්තාම අති විශාල භයානක තර්ජනයක් ගරු සභාපතිතුමනි, තියෙන්නේ.

ඉතින් මම ලිපියක් සකස් කළා ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේගේ මැදිහත් වීමෙන් නියෝජ්‍ය පොලිස්පතිතුමා දැනුවත් කරලා මට ආරක්ෂාව ලබාදීමේ කටයුත්ත කරන්න කියලා. මොකද අපට ඉල්ලන්නත් කියලා අපි ඉල්ලන්නේ නැතුව, ඇයි මොකද මේ පොලීසියේ ඉන්න සීමිත ප්‍රමාණයක් රට පුරාම බෙදෙන්න ඕන නිසා ආරක්ෂාව එපාම කියන එක තුන් පාරක් කිව්වා. ඉතින් දැන් අද ගත්තාම ගරු සභාපතිතුමනි, අපි ජනතාවට කරන සේවයත් එක්ක ගත්තාම අපට විශාල භයානක තත්ත්වයක් තියෙන්නේ. ඒකට ආරක්ෂාව සපයලා දෙන්න කියලා තමුන්නාන්සේගෙන් ඉල්ලනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ඒ ලිපිය ලැබෙන්න සළස්වන්න ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද කාරණාව පිළිබඳව නියෝජ්‍ය පොලිස්පතිතුමාට අදාළ ලිපි ලේඛණ ඉදිරිපත් කරමින් ඔබතුමාගේ අවශ්‍යතාවය වෙනුවෙන් ඉදිරි කටයුතු කරගෙන යන බව කාරුණිකව දැනුම් දෙනවා.

මීළඟට ගරු යෙහියා එම්.ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*

---

ගරු සභාපතිතුමනි, අමරපුර සංඝ සභාවේ මහා නායක දවුල්ගල ඥාණිස්සර මහානාහිමිපාණන් වහන්සේ අපවත්වෙලා තිබෙනවා. අපවත්වීම සම්බන්ධයෙන් මේ ගෞරවනීය සභාවේ ශෝකය ප්‍රකාශ කරනවා. අපේ ගෞරවනීය නායක ස්වාමීන්වහන්සේට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා ගරු සභාපතිතුමනි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------------

ස්තුතියි ! ගරු යෙහියා එම් ඉෆ්ලාර් මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද ශෝක යෝජනාව මෙම ගරු සභාවම අනුමත කරමින් උන්වහන්සේට නිවන් සුව අත්වේවා ! කියලා අපි සියළුදෙනාම ප්‍රාර්ථනා කරනවා. ඉතාම කාලෝචිත, ඉතාම වැදගත් වූ, උත්තරීතර සංඝ පීතෘන්වහන්සේ කෙනෙක් හැටියට අපි උන්වහන්සේට අපේ ශෝකය මේ අවස්ථාවේ දී පළ කරනවා.

මීළඟට ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය මැතිතුමා.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரப்பிரிய*** *Hon.Member Naminda Anurapriya* -----------
-------------------------------------------------

ගරු සභාපතිතුමනි, අපි සියළුදෙනාම දන්නවා පසුගිය දිනක දී මහනුවර ප්‍රදේශයේ පාසලක ගොඩනැගිල්ලක වහලය කඩා වැටිලා දරුවන් කිහිප දෙනෙක්ම රෝහල්ගත කරලා තිබුණ පුවත අපි ඇසුවා. මහනුවර වත්තේගම ප්‍රදේශයේ පාසලක වහලය කඩාගෙන වැටුනා, දරුවන් ගණනාවක් රෝහල්ගත කළා. ගරු සභාපතිතුමනි, මම ඒක පාදක කරගෙන කථා කළේ එවැනිම තත්ත්වයක් තිබෙන ස්ථාන කීපයක් සබරගමුව පළාතේ අපේ පාසල් කීපයකම තිබෙනවා. ප්‍රධාන පාසැලක් තමයි ගරු සභාපතිතුමනි, කෙහෙල්ඕවිටිගම විද්‍යාලය. කෙහෙල්ඕවිටිගම විද්‍යාලයේ එක වහලයක් තියනවා දැන් භාගයක් උළු ගැලවිලා තිබෙනවා. හැබැයි ඒකට අපේ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ගොඩනැගිල්ලක් ඉදිකරමින් පවතිනවා. නමුත් ඒකේ වැඩ කටයුතු අවසන් වෙලත් නෑ. වැඩ කටයුතු කෙරෙමින් පවතින්නෙත් නෑ. හැබැයි ලඟම පාසැල හොඳම පාසැල වැඩ සටහනට මෙතන බෝඩ් එකකුත් ගහලා තියනවා. හැබැයි මම දන්නා තරමේ හැටියට කෙහෙල්ඕවිටිගම විද්‍යාලය ලඟම පාසැල හොඳම පාසැල වැඩ සටහනට නෑ. ඒ වගේම ඒකේ විද්‍යාගාරයේ වහලය කැඩිලා. ඒ වගේම පුස්තකාලයේ වහලය කැඩිලා. ප්‍රධාන ශාලාවේ වහලයත් කැඩිලා තියනවා. ඉතින් ඒ නිසා අපටත් මෙවැනි ශෝචනීය තත්ත්වයන් අහන්න ඉඩකඩ තිබෙන දේ අපි තොරතුරු දැන ගත්තාම විශේෂයෙන් මතක් කළයුතුයි.

ඒ නිසා කෙහෙල්ඕවිටිගම විද්‍යාලයේ වහලය ඉතා ඉක්මණින් ප්‍රතිසංස්කරණය කරන්න කියන කාරණාව මේ අවස්ථාවේ දී යෝජනා කරනවා ගරු සභාපතිතුමනි. ඒ වගේම එල්ලාවල පහළගම විද්‍යාලය කියන පාසැලත් ඒ වගේමයි. එල්ලාවල පහළගම විද්‍යාලයේ වහලයත් කුඹුරු යායක් අයිනේ තියන පාසැලක්. ඒකේ වහලයත් මේ වගේ කැඩිලා මුක්කු, බාල්ක තියලා තිබෙන්නේ. ඉතින් ඒ නිසා අපේ සංවර්ධනය බෙදී යාමේ දී මා පෞද්ගලිකවම ප්‍රකාශ හැටියට

ඉදිරිපත් කරනවා ගරු සභාපතිතුමනි, අපේ මම හිතන්නේ මෑත කාලයේ දී වැඩියෙන්ම සංවර්ධනය වෙච්ච කාලයක් තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලය. හැබැයි ඒ කාලයෙත් සංවර්ධනය බෙදී යාමේ දී යම් විෂමතාවයන් තිබුණා. ඒ නිසා මේ සංවර්ධනය බෙදී යාමේ දී ජනප්‍රිය පාසැල්වලට මුල්තැන දීම, ඒ වගේම හොඳයි කියලා ප්‍රතිඵල ලබාගන්න ජනප්‍රිය පාසැල්වලට මුල්තැන දෙනවා වගේම ග්‍රාමීය ඉහළ ප්‍රදේශවල තිබෙන, දුෂ්කර ප්‍රදේශවල තිබෙන ඉතාමත්ම නැති බැරි පන්තියේ ජනතාව ජීවත් වෙන ප්‍රදේශවල පාසැල්වලට අඩු සැළකිල්ලක් ලැබෙන බව මා මේ සභාවේ දී විශේෂයෙන්ම මතක් කර සිටිනවා. සංවර්ධනය බෙදී යාමේ විෂමතාවය මේක. අපි දැක්කා පහුගිය කාලයෙත් ගෙවල් දෙකක් තුනක් තියන තැනට මීටර් 500, 600 කොන්ක්‍රීට් කළා. ඒ නිසා තමයි අපේ ආණ්ඩුවත් පිරිහීමට පත් වුනේ. ඉතින් ඒ නිසා මම කියන්නේ පළාත් සභාව මඟින් පාසැල් සංවර්ධනය කිරීමේ දී මේ වැසිකිලි තියන පාසැල්වලට ආයෙත් වැසිකිලි පද්ධති දුන්නා. හැබැයි මේ වහල හදන්න තියන වහලය කැඩිලා අවුරුදු 80 ක්, 90 ක් තියන පාසැල්වලට බිල්ඩිංවල තවම වහලය ඉතාම අවධානම් තත්ත්වයක තියෙන්නේ. ඒ නිසා පාසැල්වලට මුදල් බෙදීමේ දී විශේෂයෙන්ම පාසැල්වල වහලය පිළිබඳව හොයලා බලලා මේ පිළිබඳ වර්තාවක් අරගෙන ඒ සංවර්ධන කටයුතු විෂමතාවයකින් තොරව සැමට බෙදෙන අයුරින් කටයුතු කරන්න කියන යෝජනාව මේ අවස්ථාවේ දී පෞද්ගලික ප්‍රකාශ හැටියට ඉදිරිපත් කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ! නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමාට. ඔබතුමා විසින් ඉතාම වැදගත් වූ ඉදිරිපත් කරන ලද යෝජනාව, විජේනායක මන්ත්‍රීතුමා ඔබතුමාත් කථා කරන්නේ එවැනිම කාරණාවක්ද ?

*ගරු මන්ත්‍රී නිමල් විජේනායක*
*கௌரவ உறுப்பினர் நிமல் விஜேநாயக* *Hon.Member Nimal Wijenayaka*
-----------------------------------------

ඔව් ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

හොඳයි එතුමාටත් කථා කරන්න අවස්ථාව දීලා පිළිතුරු කථාව කරමු.

*ගරු මන්ත්‍රී නිමල් විජේනායක*
*கௌரவ உறுப்பினர் நிமல் விஜேநாயக* *Hon.Member Nimal Wijenayaka*
-----------------------------------------

ගරු සභාපතිතුමනි, ඇහැළියගොඩ, එපිටවල විද්‍යාලයෙත් ගිය සතියේ වහලය කඩාගෙන වැටුනා. ඇත්තටම මම කීප දෙනෙක් දැනුවත් කළා. මම ඊයෙත් ගිණුම් කාරක සභාව වෙලාවේ ලේකම්තුමාට කථා කරලා එතුමා කිව්වා ඒකට මැදිහත් වෙලා හොයලා බලලා කටයුතු කරන්නම් කියලා. ඒකත් මේ නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා කථා කරන අවස්ථාවේ දී මම මතක් කරනවා. එපිටවල විද්‍යාලය ගැනත් විශේෂ

අවධානයක් යොමු කරන්න කියලා. ගිය සතියේ වහලය කඩාගෙන වැටිලා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ! ගරු නිමල් විජේනායක මන්ත්‍රීතුමනි. ගරු අධ්‍යාපන ඇමතිතුමනි,

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ***
***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க***
*Hon.Member Ramya Kumara Weerasinghe*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ නමින්ද මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ඒ යෝජනාවම ඔයිට කලින්, මීට සභා වාර කීපයකට කලින් මේ සභාවට මම ගෙනල්ලා තියනවා. මොකද මම ඒක ගේන්න ප්‍රධාන හේතුවක් වුනේ ඔය ගොඩනැගිල්ල මමත් අපේ අධ්‍යාපන ඇමතිතුමාත් ගිහිල්ලා පරීක්ෂා කළා. ඊට එහා පැත්තේ ගොඩනැගිල්ලකට අපි මුල්ගල් තියලත් ආවා. මම මේ ඇමතිතුමාට මතක් කළෙත් ඒකයි. මේකේ ශෝචනීයම කාරණාව තමයි ගරු සභාපතිතුමනි, දැන් ඔය ගොඩනැගිල්ලේ ඡායාරූප මේ ෆෝන් එකේ තියනවා බර ගාණක්. මුක්කු ගහලා තියනවා මම හිතන්නේ 60 කට ආසන්න සංඛ්‍යාවක්. ඒ ෆොටෝස් මේ ෆෝන් එකේ තියනවා ඕන නම් පෙන්වන්න පුළුවන්. ඒකට ඉස්සරහින් මේ ගොඩනැගිල්ල වැහෙන්න බෝඩ් එකක් ගහලා තියනවා ලඟම පාසැල හොඳම පාසැල යටතේ මිලියන 66,000 ක් වෙන් කළා කියලා බෝඩ් එකක් ගහලා තියනවා. ඒ බෝඩ් එකෙන් වැහිලා මේ ගොඩනැගිල්ල පාරට පේන්නේ නෑ.

***ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය***
***கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய*** Hon. Minister
*Bhanu Munipriya* -----------
------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම ඉතාම ස්තුතිවන්ත වෙනවා මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීම. කෙසේ වුවත් අපේ නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමාත්, රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමාත් කියපු කෙහෙල්ඔවිටිගම වහලයට, මේ සම්බන්ධයෙන්ම ගොඩනැගිල්ලක් සඳහා මුල්ගල් තියලා කටයුතු කරමින් තියනවා. මේ දැන් තියන ගොඩනැගිල්ලේ කිසිම ශිෂ්‍යයෙක් වාඩිවෙලා ඉගන ගන්නේ නෑ ගරු සභාපතිතුමනි. පන්ති එකක්වත් පාවිච්චි කරන්නේ නෑ. දැන් ප්‍රභාත් ද අල්විස් ගරු මන්ත්‍රීතුමාත්, මමත්, රම්‍ය වීරසිංහ මන්ත්‍රීතුමාත් අපි තිදෙනාම ආපන ශාලාවේ ඉඳගෙන නිවිතිගල අධ්‍යාපන අධ්‍යක්ෂතුමියට කථා කරලා, විදුහල්පතිතුමාට අරගෙන මම උපදෙස් දුන්නා. හැබැයි එතුමා මට කිව්වා විභාගය තියන වෙලාවේ දී ළමයි කීප දෙනෙක් ඇතුළට ගත්තා. නමුත් කිසිසේත් මේක පාවිච්චි කරන්නේ නෑ කියලා. එමනිසා මම තදින් උපදෙස් දුන්නා දරුවෙකුට කිසිසේත් යන්න බැරි වෙන විදිහට ඒක වෙනම වැටවල් ගහලා තියන්න කියලා. ඒක ඉවත් කරන්න තියෙන්නේ. ඒ නිසා දැන් අළුත් ගොඩනැගිල්ල හැදුනාම ප්‍රශ්නය ඉවරයි. නමුත් ඒ ගොඩනැගිල්ල හැදෙන තුරුත් දරුවන්ට ඉගන ගන්න ඉඩකඩ තියනවා.

ඊළඟට එපිටවල විදුහල, එහෙම කියලා අපි බලන්නේ නෑ. ඒ ගොඩනැගිල්ල වහාම ඉවත් කරන්න අපි කටයුතු කරනවා. එල්ලාවල පහළගම සහ

එපිටවල විදුහල සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු වහාම ඉටුකරන්න සූදානම් ගරු සභාපතිතුමනි. අපි මේ වෙනකොට සියළුම වහල අබලන් අන්තරාදායක තැන්වලින් දරුවෝ ඉවත් කරන්න කටයුතු කරන්න කියලා තියනවා. ගොඩාක් තැන්වල මේ අන්තරාදායකයි කියන ගොඩනැගිලි පාවිච්චි කරන්න බැරි වශයෙන් තීන්දු කරලා ඒ ගොඩනැගිලි ඇතුලේ දරුවෝ පාඩම් කරන්නේ නෑ. ඉගන ගන්නේ නෑ. සමහර ඒවා තිබෙනවා නමුත් එසේ තිබෙන. ඒවා අපි වහාම අළුත්වැඩියා කරන්න කටයුතු කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------------

ස්තුතියි ! ගරු අධ්‍යාපන ඇමතිතුමනි. ඉතාම පැහැදිලිව ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳව.

මීළඟට ගරු අජිත් ශ්‍යාමින්ද මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී අජිත් ශාමින්ද*
*கௌரவ உறுப்பினர் அஜித் ஷாமிந்த*
*Hon.Member Ajith Shyaminda*

----------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රශ්නයත් පාසැල් සම්බන්ධවමයි. පසුගිය 4 වෙනි මාසයේ 02 වෙනිදා ඒ කියන්නේ පෙරෙයිදා දැන් මේ දවස්වල අධික වර්ෂාවත් සමඟ අකුණු ගහනවා නිතරම. පහළ මානියංගම කණිෂ්ඨ විද්‍යාලයට අකුණක් වැදිලා ඒ ශාලාවේ තිබුණ පරිගණක සහ ඒ විදුලි උපකරණ සියල්ලක්ම විනාශ වෙලා විතරක් නෙමෙයි ගින්නක් හට ගෙන ප්‍රදේශවාසීන් එකතු වෙලා තමයි ඒ ගින්න නිමුවේ. ඒ වගේම ඒ ප්‍රවේශ ගේට්ටුව, ඒ බැම්ම සියල්ල විනාශ වුනා. මේ පාසැලටම ගරු සභාපතිතුමනි, 2014 වර්ෂයේත් මේ වගේම අකුණක් වැදිලා ඒ වෙලාවේ තිබුණ විදුලි උපකරණ, පරිගණක ඇතුළු ඒ සියල්ලම විනාශ වුනා. ගරු සභාපතිතුමනි, මම ඔබතුමා හරහා අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ විද්‍යාලය නිතර අකුණු වැදෙන පාසැලක්. ඒ නිසා ඒ විදුහල්පතිතුමිය හරිම අසීරුතාවයට පත්වෙලා තිබෙනවා. පොලීසියටත් අදාළ කලාප කාර්යාලය මඟින් අමාත්‍යාංශයටත් දැනුම් දීලා තිබෙනවා. දැන් මේ උදේ කාලයේ හදීසියේ වර්ෂාවක් ඇති වෙලා ප්‍රශ්නයක් වුනොත් එහෙම ලොකු ජීවිත හානි පවා වෙන්න ඉඩ තියනවා. ඒ නිසා මේ පිළිබඳව මේ ඉදලා හිටලා ගහපු අකුණක් නෙමෙයි. මීට ඉස්සෙල්ලත් වෙලා තියන නිසා මේකේ අකුණු සන්නායකයක් සවි කරලා දෙන්න කියලා ඉල්ලීම තමයි දෙමව්පියොත්, විදුහල්පතිතුමියගෙත් ඒ සියළුදෙනාගේ ඉල්ලීම. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරලා තිබෙන ලිපිය මම සභාගත කරනවා. ඒ අනුව ගරු සභාපතිතුමනි, ඉතාම කෙටි කාලයක් තුළදී මේකට නිසි පියවරක් ගන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද පහුගිය කාලයේ වගේ වහලය කඩාගෙන වැටිලා, ඒ වගේ දෙයක් වුනොත් එහෙම අපට ඒ වුනාට පස්සේ මේක ගැන කථා කරලා වැඩක් නෑ. ඒ නිසා මගේ නිවසටත් ආසන්න කණිෂ්ඨ විද්‍යාලය. මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න කියලා ගරු සභාපතිතුමනි, ඉල්ලා සිටිනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------------

ස්තූතියි ! ගරු අජිත් ශ්‍යාමින්ද මන්ත්‍රීතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද කරුණුත් ගරු අධ්‍යාපන ඇමතිතුමා වෙත ඉදිරිපත් කරමින් පිළිතුරු ලබාදීමට කටයුතු කරනවා.

**ශෝක ප්‍රකාශ යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා : නැත.**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා : නැත.**

**පළාත් සභාවේ පොදු කටයුතු : නැත**

**මීළඟට පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ගරු රම්‍යකුමාර වීරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2017/6 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ගරු මන්ත්‍රීතුමා අවස්ථාව ලබාදෙනවා.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ***
***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க***
*Hon.Member Ramya Kumara Weerasinghe*

------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අප පළාතේ සෑම ප්‍රදේශයකම පාහේ තැපැල් පහසුකම් ලබාදීමේ දී බරපතල ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වී ඇත. තැපැල් කාර්යාල සඳහා වෙන් වී ඇති සීමා හේතුවෙන් මෑත ඉතිහාසය තුළ වසර 20 ක් වැනි කාලයක් තුළ ගම්මාන බවට පත්වී ඇති ගම්මාන තුළට ලිපි නොලැබීමේ ගැටළුවක් උද්ගත වී ඇත. මෙය නිවැරදි කර ගැනීමට නම් තැපැල් කාර්යාල සඳහා වෙන් වී ඇති සීමා දීර්ඝ කිරීම කළයුතුයි. මධ්‍යම රජයේ තැපැල් දෙපාර්තමේන්තුවට මෙම යෝජනාව යොමු කොට තැපැල් කාර්යාලවල ලිපි බෙදීමේ සීමා පුළුල් කරන ලෙස කඩිනමින් දැනුවත් කළයුතු බව මෙම ගරු සභාවට යෝජනා කරමි කියලා මේ යෝජනාව මම අරගෙන එන්නේ.

ගරු සභාපතිතුමනි, මෙහෙම යෝජනාවක් ගෙන ඒමට බලපාපු කාරණා ගණනාවක් තියනවා. අපි දන්නවා මේ තැපැල් දෙපාර්තමේන්තුවේ සීමා වෙන් කිරීමේ කටයුතු 1994 අවුරුද්දේ වුනාට පස්සේ තවම සිද්ධ වෙලා නෑ. අවසාන වශයෙන් එවැනි නිර්ණයක් වෙලා තියෙන්නේ 1994 අවුරුද්දේ. 1994 ඉඳලා මේ දක්වා වූ දීර්ඝ කාලයක් තුළ, අවුරුදු 20 කට අධික කාලයක් තුළ ගම්මාන බවට අළුතෙන් ගම්මාන පත් වුනාට ඒ පත් වෙච්ච අළුත් ගම්මාන තැපැල් සීමාවන් යටතට ගැනෙන්නේ නෑ කියලා තැපැල් කාර්යාලවලින් ඒවාට ලිපි බෙදීම සඳහා කටයුතු කරන්නේ නෑ.

ඒ අයගේ ලිපි ඔවුන්ගේ සීමාවේ අවසානයේ තියන තැනක තියලා යනවා. ආසන්නම උදාහරණයක් තියනවා ඊයේ පෙරෙයිදා විභාගයට ලියපු දරුවෙක් පිංකන්ද, අඹේගල කියන ප්‍රදේශයේ. ඒ දරුවාට ආපු ඇඩ්මිෂන් එක තැපැල්

කාර්යාලයෙන් එයාට ගිහිල්ලා දෙන්න කියලා ත්‍රීරෝද රථ රියදුරෙකුට දීලා. ඒ ත්‍රීරෝද රථ රියදුරා මේ ලිපිය ඒ ළමයා අඳුරනවා කියපු වෙන ළමයෙකුට දීලා. හැබැයි විභාගය දවසට කලින් දවසේ රාත්‍රියෙත් ඇඩ්මිෂන් එක හම්බ වුනේ නැති හින්දා මේ දරුවාගේ තාත්තායි, සේරම තැපැල් කාර්යාලයට රෑ යන්න බැරි හින්දා තැපැල් ස්ථානාධිපතිගේ ගෙදරට හොයාගෙන ගිහාම ඒ පැත්තේ ලියුම් බෙදන එක්කෙනාගේ නම කියලා එයා හම්බ වෙන්න කිව්වාම එයා මුණ ගැහුනාම එයා කියලා තියනවා මේ ත්‍රීවීලර් එකකට දුන්නේ කියලා. රෑ එළිවෙනකල් මහන්සි වෙලත් හොයාගන්න බැරි වෙලා පහුවදා විභාගයට පැය භාගයක් තියෙද්දී තමයි ඇඩ්මිෂන් එක හම්බ වෙලා තියෙන්නේ. ඒ නිසා බරපතල කාරණාවක්. ඒ වගේ සමහර තැන් තියනවා, සමහර ගම්මාන තියනවා රැකියාවකට ඉල්ලුම් පත්‍රය දාපුවාම සම්මුඛ පරීක්ෂණයට එන්න කියනවා. හැබැයි ලියුම හම්බ වෙන්නේ ටිකක් පරක්කු වෙලා, සම්මුඛ පරීක්ෂණය දිනයට පස්සේ. මේකට බලපාලා තියන ප්‍රධාන හේතුව තමයි මෙන්න මේ සීමා පුළුල් කිරීමේ කටයුත්තක් 1994 න් පස්සේ තවම තැපැල් දෙපාර්තමේන්තුවෙන් වෙලා නෑ.

හැබැයි සීමාව පුළුල් කළත් ඒ පමණින් මේ ප්‍රශ්නය විසඳෙන්න හේතුවක් වෙන්නේ නෑ. මොකද ඒ තියන සීමාවන්ට ගැලපෙන ප්‍රමාණයට තමයි තැපැල් සේවකයෝ කාර්යාලවල ඉන්නේ. ඒ නිසා සීමාව පුළුල් කරනවා වගේම ඒ සීමාව පුළුල් කරනවාට සමගාමීව තැපැල් කාර්යාලවට අවශ්‍ය ලිපි බෙදන්නන්ගේ ප්‍රමාණය වැඩි කිරීමේ අවශ්‍යතාවයකුත් තියනවා. ඒ නිසා මේ කාරණා දෙක ඉතා කඩිනමින් ඉටු කිරීමේ අවශ්‍යතාවයකුත් තියනවා. මොකද මේක අද ඊයේ මතු වෙච්ච ගැටළුවක් නෙමෙයි. දීර්ඝ කාලයක් තිස්සේ මෙවැනි ගැටළු ගමේ දී මුණගැහුනාට පස්සේ මේකට යම් විසඳුමක් හැටියට තමයි මෙවැනි යෝජනා අරගෙන එන්නේ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, මම විශ්වාස කරනවා මේ සභාවේ සියළුදෙනා මේ යෝජනාවට අනුමැතිය දෙනවා. ඒ නිසා මධ්‍යම රජයේ තැපැල් විෂයය භාර අමාත්‍යාංශයට යොමු කරලා, මේ සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගැනීමට කටයුතු කරන ලෙස ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමාට. මීළඟට ගරු අජිත් ශ්‍යාමින්ද මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අජිත් ශාමින්ද***
***கௌரவ உறுப்பினர் அஜித் ஷாமிந்த***
*Hon.Member Ajith Shyaminda*

---

ගරු සභාපතිතුමනි, රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරමින් වචන කීපයක් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. මම හිතන්නේ එතුමා ගෙනාපු යෝජනාව ඉතාම කාලෝචිතයි. අපට මතකයි මීට අවුරුදු 10 කට, 15 කට ඉස්සෙල්ලා නම් තැපෑලෙන් තමයි අපි සියළු සන්නිවේදන බහුතරයක් කරගත්තේ. ඒ වෙනකොට ඒ සියළු දේවල් තැපැල් මහත්මයා හරහා තමයි, ලියුම හරහා තමයි හැම දේම දෙන්නේ. දැන් මේ වෙනකොට නම් අපේ ගෙවල්වලට එන්නේ විදුලි බිල එන්නෙත්

නෑ. අනෙකුත් ඒ බැංකුවලින් එන ඒවා ඒ කීපයට අමතරව සමහරවිට විහාග. රජයෙන් ලබාදෙන නොයෙකුත් දැනුම් දීම් ඒ සියල්ලක්ම අත්‍යාවශ්‍යම සේවාවන් කීපයක් තමයි තැපැල් මඟින් කෙරෙන්නේ. ඉතින් අපි දැක්කා පහුගිය කාලවල්වල අපේ පළාතේ නෙමෙයි විවිධ පළාත්වල සාමාන්‍ය පෙළ, ඒ වගේම විශ්ව විද්‍යාලවලට ඉල්ලුම් කළාම ඕක ගොඩාක් සිද්ධ වෙනවා රැකියාවලට සම්මුඛ පරීක්ෂණවලට එන්න කියලා. ඉතින් අපේ ප්‍රදේශවලත් යටියන්තොට ආසනයේ 14,000 ක් විතර ද්‍රවිඩ ජනතාව ඉන්නවා. දැරණියගල 12,000 ක්, රුවන්වැල්ලෙත් 11,000 ක් විතර ඉන්නවා. ද්‍රවිඩ ජනතාව මේ තැපැල් නිසි බෙදීමක් නැති නිසා ගොඩාක් අසීරුතාවයට පත් වෙනවා. ඒ අයට යම් ස්ථානයකට තමයි ලියුමක් දීලා යන්නේ. ඉතින් මේ විදිහට බලනකොට මේක ඉතාම ලොකු ප්‍රශ්නයක් ඒ ජනතාවට. ඒ නිසා ගරු සභාපතිතුමනි, දැන් අපි දන්නවා ඉස්සරට වඩා තැපැල් ගාස්තුත් වැඩි කරලා තියනවා. තැපැල් අධිකාරියට ගිය තත්ත්වයන්වලට වඩා මේ වෙනකොට ආදායමක් තියනවා. ඒ නිසා අපි මතක් කරන්නේ මේකට නිසි ලියුම් බෙදන අය බඳවාගෙන තාවකාලිකව හරි, ඊළඟට දැන් සමහර සිංහල අය ඉන්නවා දෙමළ ඇඩ්‍රස් එක දන්නෙ නෑ. ඒ ඒ ප්‍රදේශවලට යෝග්‍ය සේවකයෝ යොදවලා ඒ නිසි ආකාරයෙන් තැපැල් බෙදීමේ කටයුතු කළයුතුයි කියලා තමයි අපේ මන්ත්‍රීතුමා මේ යෝජනාව හරහා කරන්නේ. ඒ නිසා මේක අපි එච්චරම නොසළකා හිටියාට යම් කොටසකට අසාධාරණයක් සිද්ධ වෙනවා මේ තැපැල් විධිමත්ව බෙදී නොයෑම නිසා. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි අපේ පළාතේම 21 ලක්ෂයක විතර ජනතාවට මේක මේ තැපැල් සේවාවත් අත්‍යාවශ්‍ය සේවාවක් විදිහට කටයුතු වෙන නිසා අපි ඉල්ලා සිටින්නේ මීට වඩා වැඩි අවධානයක් යොමු කරලා විශේෂයෙන් වතු ප්‍රජාවට එහෙම නැත්නම් ග්‍රාමීය ප්‍රජාවට දැන් ඇතැම් ග්‍රාමීයවලට, ඇතැම් ස්ථානවලට යන්න බැරි නිසා කාට හරි ලියුම බාරදීලා යනවා. සමහරවිට ලියා පදිංචි ලියුම් විතරයි ඒ නිවසට යන්නේ. ඒ නිසා මීට වැඩිය අවධානයක් යොමු කරලා මේ තැපැල් කටයුතු කළයුතුයි කියන හඬ තමයි අපි සියළුදෙනාම කියා සිටින්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, රම්‍ය මන්ත්‍රීතුමාගේ යෝජනාව නැවත වරක් ස්ථිර කරමින්, තැපැල් විෂයය භාර ඇමතිතුමාත්, විශේෂයෙන් තැපැල්පතිතුමාත් ඇතුළු අපේ පළාත භාර නියෝජ්‍ය තැපැල් අධිකාරී ඇතුළු සියළුදෙනාම දැනුවත් කරලා මේ තටයුත්ත නිසි ආකාරව කරලා දෙන්න, මීට වඩා වැඩි සැළකිල්ලක්, අවධානයක් යොමු කරන්න කියන යෝජනාව කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ! ගරු අජිත් ශ්‍යාමින්ද මන්ත්‍රීතුමනි. මීළඟට ගරු නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්*
*கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்* *Hon.Member Nihal Farook* -

---

ගරු සභාපතිතුමනි, ගරු රම්‍යකුමාර වීරසිංහ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ යෝජනාව සම්බන්ධයෙන් මම හිතන්නේ නොයෙකුත් අවස්ථාවල මේ සභාවේ දී අදහස් ප්‍රකාශ වෙලා තියනවා. ඒ වගේම අයවැය අවස්ථාවල දී පවා මේ ගැටළුව පිළිබඳව විශේෂයෙන්ම කරුණු ඉදිරිපත් වෙලා තිබෙනවා. අපේ අජිත් ශ්‍යාමින්ද මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු විදිහට විශේෂයෙන්ම අපේ තුන් කෝරළයට බලපාන කාරණාවක් තමයි වතුකරයේ ජනතාවට මේ තැපැල් සේවාවෙන් ලැබෙන අඩු පහසුකම් සම්බන්ධයෙන් මම හිතන්නෙ එතුමාත් කථා කළා. විශේෂයෙන්ම අද වතුකරයේ ජනතාවට මේ තැපැල්, ඒ අයට ලැබෙන ලිපි පෞද්ගලිකව ඒ අයට ලැබෙන්නේ නෑ. මොකද වතු අධිකාරිය හරහා තමයි ඒ සියළුම දේවල් ඒ අයට ලැබෙන්නේ. විශේෂයෙන්ම වතුකරයේ යම්කිසි තරුණයෙක්, තරුණියක් රැකියාවකට යොමු කරලා, සම්මුඛ පරීක්ෂණයකට නැත්නම් වෙනත් රජයේ අවශ්‍යතාවයකට ඒ අයට ලිපියක් මම හිතන්නේ ලැබුනොත් ඒක එක්කෝ සම්මුඛ පරීක්ෂණය ඉවර වෙලා තමයි ලිපිය හම්බ වෙන්නේ. ඒ වගේ බරපතල තත්ත්වයක් විශේෂයෙන්ම වතුකරයේ මේ තැපැල් බෙදා හැරීමේ තිබෙන අඩුපාඩු නිසාම සිද්ධ වෙලා තිබෙනවා. ඒ වගේම දෙමළ කථා කරන්න පුළුවන් වතුකරයේ තරුණයන් මේකට මම හිතන්නෙ තැපැල්කරුවන් හැටියට බඳවා ගන්න හැකියාව ලැබුනොත් මම හිතන්නේ ඒ ප්‍රදේශයේ ජනතාවට කරන, වතුකරයේ ජනතාවට කරන විශාල සහනයක් කියන එක මේ අවස්ථාවේ දී මම මතක් කරන්න ඕන. සබරගමුව පළාතේ විශේෂයෙන්ම කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක දෙකේම මැතිවරණ කොට්ඨාශ කීපයකම වතු ගණනාවක්ම තිබෙනවා. වතුකරයේ ජනතාවට මේ සහනය නිසි පරිදි ලැබෙන්නේ නෑ. ඒ වගේම ගරු සභාපතිතුමනි, ගම්මාන ගත්තාමත් ඒ වගේම අපි දන්නවා බොහෝ ගම්මානවලට මේ තත්ත්වය බලපාලා තියනවා. විශේෂයෙන්ම තැපැල්කරුවන් යන්නෙ නෑ සමහර ලියුම් කිලෝ මීටර් දෙකක්, තුනක්, හතරක්, පහක් ගිහිල්ලා බෙදන්න තිබෙනවා. ඒ අය කාට හරි එක්කෝ කඩයකට දීලා යනවා. නැත්නම් කාට හරි දෙනවා. ඉතින් ඒ අයට අමතක වුනොත් එහෙම අත්‍යාවශ්‍ය ලිපියක් එහෙම භාර දෙන්න වුනොත් ඒ අයට ඒක ලැබෙන්නේ ප්‍රමාද වෙලා.

ඉතින් මේ ගැටළුව නිසා සමහර අවස්ථාවල තමන්ගේ ජීවිතයේ වැදගත් අවස්ථාවකට එන ලිපියක් පවා තමන්ට නොලැබෙන තත්ත්වයක් මේ තුළින් නිර්මාණය වෙනවා. අද නවීන තාක්ෂණය පාවිච්චි කරමින් නොයෙකුත් පණිවිඩ හුවමාරු ලබා දුන්නත් මම හිතන්නේ මේ තැපැල් කාර්යාල හරහා මේ කරන මේ ලිපි බෙදා හැරීම මම හිතන්නේ ඒවා අපට එක පාරටම නවත්වන්නත් විදිහක් නෑ. මොකද අද මේ තුළින් මම හිතන්නේ යම්කිසි දෙයක් අපට ලිඛිතව ලබාදුන්නොත් තමයි ඒකට මම හිතන්නේ ඒකට නිසි අවධානය යොමු වෙන්නේ. ඒ නිසා අද අපේ රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන මේ වැදගත් යෝජනාව පිළිබඳව අපි විශේෂයෙන්ම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම අපි අද මන්ත්‍රීවරු හැටියට අපේ ආණ්ඩුකාරතුමාත් එක්කත් සාකච්ඡා කළා මේ පිළිබඳව. අපට ලබාදෙන තැපැල් පහසුකම් පිළිබඳව. මොකද අපට අද 24,000/- ක සීමාවකට තමයි සියළුම පළාත් සභා මහජන නියෝජිතයෝ විදිහට මන්ත්‍රීවරුන්ට ලැබෙන්නේ. මේ වනවිට මගේ නම් ඒ තැපැල් පහසුකම් 24,000/- සීමාව ඉවරයි. දැන් අතින් තමයි මම ලියුම් ඒ අවශ්‍ය රාජකාරි අවස්ථාවල දී. මේ වනවිට මට 25,000/- කට වැඩිය අතින් වියදම් වෙලා තියනවා මේ කාල පරිච්ඡේදය තුළ. ඒ නිසා මම හිතන්නේ අද

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට මම හිතන්නේ 180,000/- ක පමණ මුද්දර ගාස්තු නිදහස් කරලා තිබෙනවා. ඒකෙන් අඩක් අපට පළාත් සභා වරප්‍රසාද ගන්නකොට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලැබෙන වරප්‍රසාදවලින් අඩක් හිමිවෙනකොට අපට අනිවාර්යයෙන්ම අඩුම ගානේ 80,000/- ක් වත් අපට ලැබෙන්න ඕන. ඒ නිසා මේ පිළිබඳවත් අපේ විශේෂ අවධානය යොමු කරලා, විෂයය භාර ගරු අමාත්‍යවරයාට මේ පිළිබඳව දැනුවත් කරලා, මමත් පෞද්ගලිකව මේ මන්ත්‍රීවරුන්ට ඇතිවෙලා තිබෙන ගැටළු පිළිබඳව එතුමාට ලිපියක් මඟින් යොමු කළා. අපේ තැපැල් පහසුකම් පිළිබඳව ඇතිවෙලා තිබෙන ගැටළුව සම්බන්ධයෙන්. ඉතින් මේ පිළිබඳව විෂයය භාර ඇමතිවරයා දැනුවත් කරලා මේ ජනතාවට මේ තුළින් වඩ වඩාත් සමීප වන ආකාරයට මේ සේවාවන් කරගෙන යාමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින්, අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට නැවත වතාවක් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ස්තුතියි ! ගරු නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමාට. මීළඟට යෙහියා එම්.ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*

----------------------------------------

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාව අපි හැමෝටම නගරබද ඒක නොදැනුනත්, ග්‍රාමීය ප්‍රදේශවල දැඩි ලෙස දැනෙන, ඒ වගේම යම් යම් අවස්ථාවල විවිධ අපහසුතාවයන්ට මුහුණ දෙන්න සිදුවෙන එක් අවස්ථාවක් තමයි මේ ගෙන එන ලද යෝජනාව. අපි කොහොම කිව්වත් පළාතේ සෑම ප්‍රදේශයකම පාහේ තැපැල් පහසුකම් ලබාදීමේ බරපතල ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වී තිබෙන බව අපට පේනවා. සමහර අවස්ථාවල කැඳවීම් ලිපි ලැබෙනකොට පරක්කු වෙලා ලැබෙන්නේ. ග්‍රාමීය ප්‍රදේශවල යම් යම් ස්ථානවල ඒ ලිපි බෙදීමට ඇති පණිවිඩකරුවන්ගේ තිබෙන අඩුපාඩු සහ ඒ වගේම පුළුල් නොකිරීම තුළ ඇත්ත වශයෙන්ම මෙය වැඩියෙන්ම බලපාන්නේ වතුකරයේ ජනතාවට දැඩිලෙස මුහුණ දෙන්න තියන අවස්ථා. ඒ වගේම මම දකිනවා විවිධ අවස්ථාවල දී විවිධ සම්මුඛ පරීක්ෂණ කැඳවීම් ලිපි ලැබෙනකොට ඒ නිශ්චිත දිනය පසුවෙලා තමයි සමහර උදවියට ලැබෙන්නේ. ජීවිත කාලයටම තමන්ට යම් වරප්‍රසාදයක් හෝ යම්කිසි ලැබීමක් ලැබෙන්න තිබුණා නම් ඒ අතපසු වෙන වෙලාවල් සහ ඔවුන්ට නොලැබෙන අවස්ථා අපි දැකලත් තියනවා. මේ වෙනකොටත් මම දන්නවා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලිපි යවනවා, සම්මුඛ පරීක්ෂණවලට. නිශ්චිත අයට දින පහුවෙලා ලිපි ලැබිලා තියෙන්නේ. ඒ අයට ඒ දිනයට සම්මුඛ පරීක්ෂණවලට යන්න බැරි අවස්ථා අපි මේ වෙනකොට දැකලා තියනවා.

ඒ එක්කම ගරු සභාපතිතුමනි, තැපැල් කාර්යාල සඳහා වෙන්ව ඇති සීමා හේතුවෙන් මෑත ඉතිහාසය තුළ ගම්මාන බවට පත්ව ඇති වසර 20 ගම්මාන තුළ ලිපි නොලැබීමේ ගැටළු උද්ගත වී ඇත. මෙය නිවැරදි කර ගැනීමට නම් තැපැල් කාර්යාල සඳහා වෙන්ව ඇති සීමා දීර්ඝ කිරීම කළයුතුය. නමුත් ඒකත් හොඳයි. නමුත්

වසර 20 ක් ගැන කියනකොට මට මතක් වුනා අපේ රම්‍යකුමාර මන්ත්‍රීතුමා පහුගිය කාලයේ, පහුගිය ආණ්ඩුව කාලේ මේක රජයට ඉදිරිපත් කරලා කළා නම් වඩා හොඳයි. ඒ කොහොම වුනත් ඒ කාලයේ ඔබතුමාට කරන්න බැරි වුනත් මේ කාලයේ හරි ඔබතුමා තේරුම් අරගෙන අපි මේ යෝජනාව ගෙනල්ලා මේක මධ්‍යම ආණ්ඩුවේ තැපැල් හා ඉස්ලාමීය ආගමික කටයුතු ගරු අමාත්‍යතුමාට දැනුවත් කරලා මේ කටයුත්ත කිරීමට උනන්දු කිරීම වැදගත් වෙනවා. කොහොම වුනත් මෙවැනි දේවල් අපි කිරීම වැදගත්. මොකද අපි හැමෝගෙම බලාපොරොත්තුව, අධිෂ්ඨානය ජනතාවට සේවය කිරීම. ජනතාවට සේවය කිරීම නම් මේ තුළ සිදුවිය යුතුයි.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*
*கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க*
*Hon.Member Ramya Kumara Weerasinghe*

-------------------------------------------------------

ඔය කාලයේ ආණ්ඩු දෙකම තිබුණා.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*
*கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*
*Hon.Member M.Y.M.Iflar*

----------------------------------------

නෑ, වැඩියෙන්ම තිබුනේ, වැඩිම කාලයක් තිබුනේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව. කොහොමත් කමක් නෑ. ප්‍රශ්නයක් නෑ. මම ආණ්ඩුවට දොස් කියන්න ගියෙත් නෑ. ඔබතුමාගේ ඉල්ලීම වැදගත්. ඒක අපි අගය කරනවා. මොකද අපි හැමෝගෙම අධිෂ්ඨානය, බලාපොරොත්තුව ජනතා සේවය. මහජනතාව වෙනුවෙන් යහපතක් කරන්න නම්, මම එක හෙළාම, මොකද මේක දකින්නේ මම ජීවත් වෙන නගරයේ. මට මේක ප්‍රශ්නයක් නෑ. නමුත් ගම්බද, දුෂ්කර ප්‍රදේශවල විශේෂයෙන් වතුකරයේ ඉන්න අයට මේකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තියනවා. අනෙක් එක තමයි මේ එක ලියුම් කැල්ලකින් දවසින් දෙකෙන් එන්න තියන එක සුමාන ගානක් තුළ විවිධ අපහසුතාවයට ලක්වෙන උදවිය අපි දකිනවා. ඒ නිසා මේක වැදගත් යෝජනාව. මේ යෝජනාව අපි මේ සභාවේ සාකච්ඡා කරලා, සම්මත කරලා, මේක ඉහළට යවලා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න පුළුවන් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන්න ඕන. මොකද මේ යෝජනා සාකච්ඡා කිරීම නෙමෙයි අපි බලාපොරොත්තු වෙන්නේ. මේ යෝජනාව මේ සභාව තුළ සාකච්ඡා කරලා, මේක අදාළ අමාත්‍යාංශවලට යොමු කරලා, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරලා මේ තුළ යම් සහනයක් අපේ ප්‍රදේශවල ජීවත් වෙන ජනතාවට සහනයක් ලැබෙනවා නම් ඒ තරම් තෘප්තියක් අපි වෙන දෙයක් ලබන්නේ නෑ. ඒ නිසා මේ යෝජනාව අනුමත කරමින්, මේ යෝජනාව ඒ කාලයේ කරන්න බැරි වුනත් මේ කාලයේ හරි අපි යමක් කරලා මේ යහ පාලන ආණ්ඩුවේ යම් දෙපැත්තම ඉන්න නිසා ඔබතුමා ඒකාබද්ධයට වෙලා විරුද්ධ වෙලා ඉන්නේ නැතුව සහයෝගයෙන් කටයුතු කරලා, මේවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරලා අපි සියළුදෙනාට සහනයක් ලැබෙන ආකාරයෙන් කටයුතු කරන්න සියළුදෙනාට ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවා ! කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ! යෙහියා එම් ඉස්ලාර් ගරු මන්ත්‍රීතුමාට. මීළඟට ගරු මන්ත්‍රී බී.ආරියවංශ ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී බී.ආරියවංශ*
*கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ* *Hon.Member B.Ariyawansha* ------
--------------------------------------

ගරු සභාපතිතුමනි, අපගේ රම්‍යකුමාර මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. දුෂ්කර ප්‍රදේශයක සිටින, කොලොන්න වගේ ප්‍රදේශයක විශේෂයෙන්ම තැපැල් පහසුකම ලැබෙනකොට මේ ප්‍රශ්නය ගොඩාක්ම බලපානවා ගරු සභාපතිතුමනි. එමනිසා අපි දන්නවා ජනගහණ වර්ධනයත් සමඟ මේ වෙනකොට ඒ තැපැල් ලිපි ලැබීමේ කාලය දින තුන, හතර, පහ පහුවෙලා තමයි ලිපි ලැබෙන්නේ. එමනිසා 1994 වර්ෂයෙන් පසුව මේ වෙනකල් ඒ නව ගම්මාන ඇතුළත් කරලා, ඒ සීමා ඇතුළත් කරලා, ඒ තැපැල් කොට්ඨාශ නම් නොකිරීම නිසා තමයි විශේෂයෙන්ම මේ ගැටළුව යොමු වෙලා තියෙන්නේ. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මේ වෙනකොට තැපැල් කන්තෝරුව, එහෙම නැත්නම් උප තැපැල් කාර්යාලය, මේ කාර්යාලවල අවශ්‍ය කරන සේවකයින් සංඛ්‍යාව ඉතාම අඩුවෙන් තියෙන්නේ. අපි දැක්කා සමහර තැපැල් කන්තෝරුවල හය දෙනා, හත් දෙනා අවශ්‍ය ලිපි බෙදුම්කරුවන් අවශ්‍ය වුවත් එයින් ඉන්නේ හරි අඩකට වගේ ප්‍රමාණයක්. 1986 තමයි මේ කාර්යාලවලට අවශ්‍ය කරන සේවකයින් ප්‍රමාණය අනුමත කරලා තියෙන්නේ. මෙතෙක් වෙනකල් ඒ කාර්යාලවලට අවශ්‍ය කරන සේවකයින් බඳවා ගැනීමට නොහැකිව ඒ තැපැල් කාර්යාලවල තැපැල් ස්ථානාධිපතිවරුන් ඇතුළු ඒ කාර්යය මණ්ඩලය බලවත් ප්‍රශ්නවලට මුහුණ දීලා තියනවා ගරු සභාපතිතුමනි.

ඒ වගේම තමයි ප්‍රධාන තැපැල් කාර්යාලවලට අමතරව අපි දන්නවා ගම්වල නිවාසවල එහෙම නැත්නම් යම් යම් ස්ථානවල කුඩා තැපැල් කාර්යාල පිහිටුවලා තියනවා. ඒ තැපැල් කාර්යාලවලට ගෙවන කුලිය එදා අසූ ගණන්වල, හැත්තෑ ගණන්වල ගෙවපු රු.250/-, 300/- වගේ කුලියක් තමයි මාසයකට ගෙවන්නේ. ඒ වගේ ප්‍රශ්නයක් වුනා පසුගිය දවස්වල කැල්ල තැපැල් කාර්යාලය සුළු මුදලක් ගෙවලා එක ස්ථානයක පවත්වාගෙන ගියා. මේ වෙනකොට වෙළඳ වටිනාකමත් සමඟ ඒ ස්ථාන අධික මිළකට බදු දීමට තිබෙන නිසා ඒ ස්ථානයෙන් තැපැල් කාර්යාලය අයින් කරගන්න කිව්වා. ඒ අවස්ථාවේ දී වෙනත් කිසිම තැනක් හොයාගන්න බැරි වුනා රුපියල් 250 කට, 300 කට වගේ සුළු මුදලකට ස්ථානයක් හොයා ගන්න බැරුව. එමනිසා දැනට වෙනත් ස්ථානයක ස්වෙච්ඡාවෙන් වගේ දීලා එම ස්ථානයේ තැපැල් කාර්යාලය පවත්වාගෙන යනවා. එම නිසා මේ වගේ කුඩා ගම්මානවල පවත්වාගෙන යන තැපැල් කාර්යාලවලට අවශ්‍ය පහසුකම් සපයලා ඒ බදු මුදල් යටතේ ගන්න තියන ඒ තැපැල් කාර්යාලවලට අවශ්‍ය බදු මුදල් වැඩි කිරීම තුළින් ඒ ප්‍රදේශයේ ජනතාවට සේවය කිරීමටත්, ඒ වගේම ඒ කාර්යය මණ්ඩලය අපහසුතාවයට පත් නොවීමටත් කටයුතු කිරීමට හැකියාව ලැබෙනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා අපි දන්නවා අද නව තාක්ෂණික ක්‍රම මඟින් අද ලිපි ලේඛණ ගනුදෙණු හුවමාරු වුනත් අපි දන්නවා ඉතිහාසයේ පටන් විවිධ ක්‍රම මඟින් තමයි මේ ලිපි ගනුදෙණු වුනේ. ඉන් පසුව

තමයි තැපැල් සේවය ආරම්භ කරලා තැපැල් මඟින් මේ වැඩ කටයුතු කරගෙන යන්න පටන් ගත්තේ. ඒත් තැපැල් සේවයේ දියුණුවක් අපි දීර්ඝ කාලයක සිට දැක්කේ නෑ. එමනිසා තමයි අපේ රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමාත්, ඒ වගේම අපේ අනෙකුත් මන්ත්‍රීතුමන්ලාත් ඒ යෝජනාව අනුමත කරමින්, අපි සියළුදෙනාම අනුමත කරමින් ප්‍රදේශයේ ජනතාවට වැදගත් ලිපි කඩිනමින් තමන්ගේ නිවසට ලැබීමට සැළැස්වීමට හැකිවන අයුරින් වැඩ පිළිවෙලක් දියත් කරන්න කියලා මම ගරු රම්‍යකුමාර මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ස්ථිර කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු බී.ආරියවංශ මන්ත්‍රීතුමාට. මීළඟට ගරු අජිත් කුමාර මැද්දේගම මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார*
*Hon.Member Ajith Kumara*

---

ගරු සභාපතිතුමනි, රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් වචන කීපයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. අබි මතක් කරන්න ඕන විශේෂයෙන්ම, ලංකාවේ පුරවැසියෝ හැම කෙනෙක්ම බලාපොරොත්තු වෙනවා තමන්ට අවශ්‍ය කරන රජයේ හෝ පුද්ගලික දැනුම් දීමක් ලිපියක් මඟින් දැනුම් දෙයි කියන විශ්වාසය. ඒ විශ්වාසය තහවුරු කරමින් තැපැල් දෙපාර්තමේන්තුව විශාල රාජකාරියක් කරන බව අපි අනිවාර්යයෙන්ම දන්නවා. හැබැයි දැනට වසර කීපයකට පෙර වතුකරයේ ජනතාවට ලිපියක් ලැබෙනකොට ඒ ලැබුනේ තැපැල් දෙපාර්තමේන්තුවෙන් වත්තට ගිහින් දෙනවා. වත්තේ කවුරු හරි පුද්ගලයෙක් මේ ලිපි අවශ්‍ය කරන පුද්ගලයන්ට බෙදා හරිනවා. මොකද භාෂාව ප්‍රශ්නය සහ ස්ථාන පිළිබඳ ගැටළුවක් නිසා. එහෙම නිසා වෙන්නත් පුළුවන්. සමහරවිට වතු අධිකාරිගේ අධිකාරී බලය පවත්වාගෙන යාමට අවශ්‍යතාවය නිසාත් එහෙම වෙන්න පුළුවන්. කොහොම හෝ ඒ අයට ඒ ආකාරයෙන් ලිපි ලැබුණා. හැබැයි දැන් ඒක වෙන්නේ නෑ. දැන් තැපැල් දෙපාර්තමේන්තුවෙන්ම තමයි මේ බෙදා හැරීමේ කටයුත්ත කරන්න වෙන්නේ. විශේෂයෙන්ම මම නියෝජනය කරන ප්‍රදේශයේ අකරැල්ල ප්‍රදේශය සිංහල, ද්‍රවිඩ ජනතාව ගොඩාක් ජීවත් වෙන ප්‍රදේශයක්. බහුතරය ඉන්නේ සිංහල ජනතාව. මේ ප්‍රදේශයේ ලියුම් බෙදන්නෙම නෑ. අපි කීප වතාවක් සම්බන්ධීකරණ කමිටුවේ දී කථා කරලා මේ ලිපි බෙදීම සම්බන්ධව අපි කථා කරලා තියනවා. සාකච්ඡා කරලා තියනවා. ඒ වගේම සභාපතිතුමනි, අපි මතක් කරන්න ඕන දැනට වසර 25 කට, 30 ට විතර ඉස්සර වෙලා මේ ලිපි බෙදන්නේ නැති ගම්මානවල උප තැපැල් කාර්යාල, පුද්ගලික නිවෙස්වල උප තැපැල් කාර්යාල පවත්වාගෙන ගියා. ඒ තැපැල් කාර්යාලයට තමයි ලියුම් ටික ලැබෙන්නේ. තමන්ට ලියුමක් තියනවා ද කියලා තැපැල් කන්තෝරුවෙන් ඇවිල්ලා ලිපි ගන්න ක්‍රමයක් තිබුණා විශේෂයෙන් ඔය රංවල දිහාවේ , ඒ වගේම හඳගිරියේ වගේ පැතිවල හටන්ගල ඒ වගේ තැන්වල ඒ ආකාරයට තමයි, කවුරුවත් බෙදන නිළධාරියෙක්ව එතැනට යොදලා තිබුනේ නෑ. හැබැයි දැන් ඒ තැන්වලත් ඒ බෙදන නිළධාරීන් ඉන්නවා. කීප දෙනෙක් ඉන්නවා එක්කෙනෙක් හරි, දෙන්නෙක් හරි මේ ලියුම් බෙදන අය. හැබැයි සමහර වෙලාවට දැන් රජයේ සීල් එකක් එහෙම ගහලා ලියුම් ගොඩාක් ගිහාම මේවා

ගංගාවල තියන තැන්වලුත් ගොඩාක් තියනවා. දොළවල්වල තියන වෙලාවලුත් තියනවා. එහෙම නැතුවා එහෙම නෙමෙයි. කෙසේ වෙතත් හරි නරක පුරුද්දක් තියනවා ගරු සභාපතිතුමනි, ඕනෑම පුරවැසියෙකුට අයිතියක් තියනවා තමන්ට ලැබෙන ලිපිය ඒක තමන්ගේ අතට පත් වෙනකල් ඒක, වගකීමක්. හැබැයි අපි දකිනවා සමහර තැන්වල අහවල් ස්ටෝස් එක බාරේ, තමයි මේ ලියුම් යන්නේ. මොකද ඒ ගම්මානවලට ලියුම් බෙදන්නේ නෑ. කඩේ තමයි ලියුම දාලා යන්නේ. ලියුම් මිටියක් තියනවා, ලියුම් පෙට්ටියක් තියනවා කඩේ. සමහර අයට එන ලියුම් කඩේ මුදලාලි දන්නේ නැති වෙන්න පුළුවන් කවුද බලන්නේ කියලා. මට ලියුමක් තියනවාද කියලා බලපු ගමන් වැදගත් ලියුමක් තිබ්බොත් වෙන කෙනෙක්ගේ හරි ඒක අරගෙන ගිහිල්ලා ඒක නැති කරන්න පුළුවන්.

ඒක ඉතාම ශෝචනීය අවස්ථාවක් වෙනවා. ඒ පුද්ගලයන්ට ඒ තමන්ගේ තියන අයිතිය නැති වීමක් වෙනවා. හැබැයි ඒ ලියුමට වෙච්ච දේ දන්නේ නැති හින්දා කාලයක් ගියත් සමහර අය අපට ඇවිල්ලා කියනවා අපි විභාගෙ ලිව්වා. ප්‍රතිඵල ආවේ නෑ. සමහර අය කියනවා අපට ඇඩ්මිෂන් එක ආවේ නෑ. සමහර අය පිට රටින් එන ලිපියක් ලැබුණ නැති අය ඉන්නවා. නොයෙක් විදිහේ දුක් ගැනිවිලි අපට කියනවා. නමුත් හොයන්න දිහාවක් නෑ. ඒ නිසා රම්‍යකුමාර මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාම කාලෝචිතයි. මම හිතන්නේ දැන් අවුරුදු පහළොවකට විතර ඉස්සෙල්ලා තමයි මේ තැපැල් පියුම් මහත්වරු මාර්ගවලට යොමු කරලා තිබුනේ. එයින් පස්සේ සංශෝධනයක් වෙලාම නෑ. එතුමා මතක් කරන විදිහට නාගරීකරණය නිසා, දියුණුව නිසා, ගම් මණ්ඩි වැඩියෙන් සකස් කරලා තියන නිසා ඒ ප්‍රදේශවලට ලියුම් බෙදුම්කරුවෙක් අවශ්‍ය වෙනවා. ඒ නිසා මේ යෝජනාව ඉතාම වැදගත්. මේ යෝජනාව මධ්‍යම ආණ්ඩුවට දැනුම් දීලා, නැවත සංශෝධනයක් කරලා, ප්‍රතිශෝධනයක් කරලා මේ ලියුම් බෙදුම්කරුවන්ගේ සේවාව ඒ මාර්ග ප්‍රමාණය වැඩි කරන්න කටයුතු කරනවා නම් ඉතාම වැදගත් කියන එක අපි මතක් කළා. ඒක නිසා ඒක ඉතා කාලෝචිත යෝජනාවක්. විශේෂයෙන්ම සෑම පුරවැසියෙකුටම අයිතියක් තියනවා තමන්ට ලැබෙන ලිපිය තමන්ගේ අතට ලැබීමට. ඒ නොලැබීම තුළ පහුගිය වකවානුවල රූපවාහිනියට, ගුවන්විදුලියට කථා කරන්න පුළුවන් පුද්ගලයෝ කථා කෙරුවා තමන්ට වෙලා තියන අසාධාරණය පිළිබඳව. එහෙම කථා කරන්න බැරි අය කොච්චර ඉන්න ඇද්ද. එහෙම කථා කරන්න තමන්ට පහසුකමක් නැති අය කොච්චර ඉන්න ඇද්ද. ඒක නිසා මේ ජනතා අවශ්‍යතාවය ඉටු කිරීමට මුල පුරන්න යෝජනාවක් හැටියට අපේ රම්‍යකුමාර මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව බොහොම ඕනෑකමින් ස්ථිර කරමින් මේක දන්වා යැවීමට කටයුතු කරන ලෙස මතක් කරමින්, නිහඬ වෙනවා. බොහොම ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! අජිත් කුමාර මැද්දේගම ගරු මන්ත්‍රීතුමාට. ගරු රම්‍යකුමාර වීරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 6/1/2017/6 දරණ යෝජනාව පිළිබඳව ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මැති ඇමතිතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද ඉතාම වැදගත් වූ, ඉතාම අත්‍යාවශ්‍ය වූ, ඉතාම වටිනා වූ යෝජනා සියල්ලම අද දවසේ දී ක්‍රියාවට නැංවීමට වඩාම සුදුසු යෝජනා බවට මේ ගරු සභාව පිළිගන්නවා. ඒ අනුව විධිමත් ලෙස ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා අදාළ අමාත්‍යාංශය වෙතත්, අදාළ ආයතන

වෙතත් එම යෝජනාවත් ඔබතුමන්ලාගේ අදාළ තොරතුරුත් ලබාදීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙනවා.

මීළඟට දෙවෙනි යෝජනාව හැටියට ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2017/7 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබාදෙනවා.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ***
***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க***
*Hon.Member Ramya Kumara Weerasinghe*

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතිවන්ත වෙනවා. මොකද මේක අද මම විශ්වාස කරනවා අද මම ඉදිරිපත් කරන යෝජනාව මේකත් මේ සභාවේ පක්ෂ විපක්ෂ කිසිම භේදයක් නැතිව අපේ මන්ත්‍රීවරු සියළුදෙනාම එකා වගේ අනුමත කරයි කියලා මම විශ්වාස කරනවා. මොකද අපි හැමෝටම ඉතාම ප්‍රබලව බලපාන යෝජනාවක්. සබරගමුව පළාත තුළ පළාත් සභාවට අයත් දුෂ්කර ගම්මාන 50 ක කුඩා පාසැල්වලට ද රේඛීය අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති පළමු වසර සඳහා සිසුන් බඳවා ගැනීමට අදාළ චක්‍රලේඛ බලපැවැත්වීමේ හේතුවෙන් බරපතල අර්බුදයක් උද්ගත වී ඇත. විශේෂයෙන්ම ශිෂ්‍ය සංඛ්‍යාව තීරණය කිරීමට අදාළ නියෝග ක්‍රියාත්මක කිරීමේ දී සිසුන් ගණනාවකට සහ ගමේ පාසැල් අසළ දරුවන්ට කිසිදු පාසැලක් අහිමි වීමේ තත්ත්වයක් උද්ගත වී ඇත. මෙම තත්ත්වය සමනය කිරීම සඳහා අදාළ චක්‍රලේඛයෙහි පන්ති කාමරයක ශිෂ්‍ය සංඛ්‍යාව, ඉඩම් අයිතිය ආදී කොටස් කීපයක් පළාත් පාසැල් සඳහා බල නොපාන පරිදි සංශෝධනය කිරීමට රේඛීය අමාත්‍යාංශයට යෝජනා කළයුතු යැයි මේ ගරු සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව මෙහෙම අරගෙන එන්නේ පළමු වසර සඳහා සිසුන් බඳවා ගැනීමට ඉසුරුපායෙන් නිකුත් කරපු පළවෙනි වසරට සිසුන් ඇතුළත් කිරීමේ මේ චක්‍රලේඛය අපි අරගෙන කියවලා බලනකොට මේක කියවන්න ඉස්සෙල්ලා දැන් ඉන්න මන්ත්‍රීවරු හැමකෙනා ළඟටම ගිහිල්ලා ඇති. දැන් අපි එදා ඇහුවා මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා භාණු මුණිප්‍රිය ගරු ඇමතිතුමාට. මේ යෝජනාව ඉදිරිපත් කරනවාත් එක්කම අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට මේ යෝජනාව අරගෙන ඇවිල්ලා මේක ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර අරගෙන ඒකට කමිටුවකුත් එතුමා දැන් පත් කරලා ඉවරයි. අපට යෝජනාව කලින් දවසේ ඉදිරිපත් කරන්න බැරි වුනා. දැන් එක් මම හිතන්නේ වාර දෙකක් කල් ගිහිල්ලා තමයි අපි අද ඉදිරිපත් කරන්නේ. ඒ නිසා ඒ පිළිබඳව එතුමාටත් මම ස්තුතිවන්ත වෙන ගමන් මම විශේෂයෙන්ම කියන්න ඕන එදා උපදේශක කාරක සභාවේ දී අපි ඇහුවා ළමයි කී දෙනෙක් මේ අප්‍රේල් මාසේ අද 04 වෙනිදා. පළවෙනි වසර සඳහා ඉස්කෝලයක් නැතුව ළමයි කී දෙනෙක් ගෙදර ඉන්නවාද කියලා මේ දිස්ත්‍රික්කයේ අපි අහලා බැලුවොත් ඒ සංඛ්‍යාව ගරු සභාපතිතුමනි, 1000 කට වැඩියි. මම විතරක්, මගේ කාර්යාලයෙන් විතරක් එහෙම ඉන්න දරුවෝ 50 කට වැඩි ගාණකට මේ වෙනකොට ලිපි ලබාදීලා තියනවා අපේ අධ්‍යාපන ලේකම්තුමාට සුදුසු පාසැලක් දෙන්න කියලා. හැබැයි කිසිම පාසැලක් නැතුව තවමත් පළවෙනි වසරට ඇතුළත් වියයුතුව තිබෙන දරුවෝ පළවෙනි වසරට ඇතුළත් නොවී ගෙදර තවම ඉන්නවා කියන එක ඉතාම ශෝචනීය තත්ත්වයක් කියන එක අපි මේ වෙලාවේ ඉදිරිපත් කරන ගමන් විශේෂයෙන් මතක් කරන්න ඕන.

මේක මෙහෙම කිව්වාට පස්සේ සමහරෙකුට මේකට තර්ක කරන්න පුළුවන් කමක් ලැබෙනවා. ගමේ පාසැලක් තියෙනවා. ළඟ තියන පාසැලට යන්නේ නැතුව ඊට එහා පැත්තේ තියන වඩා හොඳ ඉස්කෝලෙට ළමයා දාගන්න ගිහිල්ලා තමයි මේ වැඩේ කරගෙන තියෙන්නේ කියලා සමහරු කියනවා. හැබැයි උදාහරණයක් හැටියට පැබොටුවේ ඉස්කෝලේ ඉස්සරහා ඉන්න එක්කෙනා පැබොටුවේ ඉස්කෝලෙට ඇප්ලිකේෂන් එක දාලා, දරුවාට පැබොටුවේ ඉස්කෝලේ කියනවා භාරගන්න බෑ කියලා. මොකද එයාට ඉඩමේ අයිතියේ දී ලකුණු 10 ක් අඩු වෙනවා. ඊට වඩා වැඩියෙන් ලකුණු ගත්ත කට්ටියක් ගන්නවා. පන්ති කාමර සංඛ්‍යාවයි, පන්තියකට අදාළ ශිෂ්‍ය සංඛ්‍යාවයි බැලුවාම අර ළමයාට මේ ඉස්කෝලෙට එන්න ඉඩක් නෑ. ඒ නිසා එහෙම ප්‍රශ්න තියනවා. ඒ නිසා විශේෂයෙන්ම මම කියන්න ඕන එහෙම යෝජනා කරනකොට සමහර වෙලාවට තව ගම්වල තියනවා ළමයි හතර දෙනෙක්, පස්දෙනෙක්, එකොලොස්දෙනෙක් ඉන්න ඉස්කෝල. ඒවායේ කිසිම පහසුකමක්, දියුණුවක් ඇති වෙන්නේ නැතුව තියනවා. හැබැයි අපි කියනවා ළඟ ඉස්කෝලෙට ළමයා දාන්න කියලා. අපේ ළමයා අපි හොඳ ඉස්කෝලෙකට දානවා. අපි ගමේ මිනිහාට කියනවා ළඟ ඉස්කෝලෙට ළමයා දාන්න කියලා. ළඟ ඉස්කෝලේ තියෙද්දී ඇයි බැරිද කියලා. ඒ නිසා විශේෂයෙන් අපේ අධ්‍යාපන ඇමතිතුමාට මම මේ යෝජනාව මීට කලිනුත් කියලා තියනවා. මම අදත් ඉදිරිපත් කරනවා. ගමේ ප්‍රාථමික පාසැලක් තියනවා නම් ඒ ප්‍රාථමික පාසැල නගරයේ පාසැලක් හා සමානව සංවර්ධනය කරලා අවශ්‍ය සියළු පහසුකම් ටික දීලා අපි ඒක ප්‍රාථමික පාසැලක් විදිහට විතරක් සංවර්ධනය කරන්න කටයුතු කරලා අපි ඒකට යන්න කිව්වාට වැරැද්දක් නෑ. හැබැයි ගරා වැටෙමින් තියන, ළමයි හතර පස් දෙනෙක් ඉන්න ඉස්කෝලෙට ගමේ අහිංසක මිනිහාගේ ළමයාට යන්න කියලා, තියන එකාගේ ළමයා හොඳ ඉස්කෝලෙකට දාන්න කියන එක වැරදියි. මොකද මගේ මතය, මගේ අදහස තමයි දරුවෝ වෙනුවෙන් පාසැල් හදලා තියනවා මිසක් පාසැල් වෙනුවෙන් දරුවෝ හදලා නෑ. පාසැල් රකින්න දරුවෝ හදලා නෑ. දරුවෝ රකින්න, දරුවෝ පෝෂණය කරන්න පාසැල් හදලා තියනවා මිසක්. ඒ හින්දා අපි පාසැල රැක ගැනීම සඳහා දරුවා බිලි දීමේ ක්‍රමවේදය අවසන් කරන්න කාලය ඇවිල්ලා තියනවා කියන එක අපි මේ වෙලාවේ විශේෂයෙන් මතක් කරන්න ඕන. ඒ නිසා මේ චක්‍රලේඛයේ තියනවා 3/1 , 2016 වර්ෂයේ දී 40 ක් වන අතර, පන්තියකට බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ඊට පසු වර්ෂවල ළමයින් ඇතුළත් කිරීමේ දී වර්ෂයකට එක් සිසුවෙක් බැගින් අඩු කොට 2021 වනවිට පන්තියේ ශිෂ්‍යය සංඛ්‍යාව 35 දක්වා අඩුවිය යුතුයි කියන එක. මේක සම්පූර්ණයෙන් අයින් කරලා පරණ ඉස්සර තිබුණ නීතිය ආපහු මෙතෙන්ට ගලපන්න ඕන කියලා මම යෝජනා කරන්නේ.

මොකද ගරු සභාපතිතුමනි, අපට පන්තියේ ශිෂ්‍යය සංඛ්‍යාව 35 කරලා උගන්වන්න පුළුවන් නම් ඒක හොඳයි. ඒක නරකයි කියලා අපි කිසිසේත් කියන්නේ නෑ. කවුරු ගෙනාවත් අකිල විරාජ් ඇමතිතුමා ගෙනාවා කියලා ඒක නරක යෝජනාවක් කියලා අපි කියන්නේ නෑ. හොඳ යෝජනාවක්. මොකද පහසුවෙන්, හොඳ මානසිකත්වයකින්. හොඳට ඉගන ගන්න පුළුවන් වෙනවා නම් ඒක හොඳයි. හැබැයි මේක ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට යෑමේ දී පන්ති ගාණ වැඩි කරන්න වෙනවා. ගුරුවරු ගාණ වැඩි කරන්න වෙනවා. යටිතල පහසුකම් ප්‍රමාණය වැඩි කරන්න වෙනවා. මේ ටික ඉෂ්ඨ නොවී පන්තියේ ළමයි ගාණ විතරක් අඩු කරන්න ගිහිල්ලා අද බරපතල ලෙස අමාරුවේ වැටිලා තියනවා විදුහල්පතිවරු, ඒ වගේම දරුවෝ. ඒ නිසා මේක ඉවත් කරන්න ඕන පළාත් සභාවලට, අපට

ගැටළුවක් නෑ මධ්‍යම රජයේ පාසැල්වලට මේක තිබුණාට. හැබැයි ගමේ පාසැලට පළාත් සභාවේ පාසැලෙන් මේක අයින් කරන්න ඕන 40 ශිෂ්‍යය සංඛ්‍යාව කලින් තිබුණ එක අපට දිගටම අවශ්‍යයි. මම දන්නවා මන්ත්‍රීවරු හැම කෙනාම වගේ නිතරම මේ සභාවේ මේ පිළිබඳ ගැටළුව මතු කරනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, 3/7 පරිපාලන දිස්ත්‍රික් බල ප්‍රදේශය පෝෂිත ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලැබේ. එතකොට මේ මුළු දිස්ත්‍රික්කයේම පෝෂිත ප්‍රදේශය හැටියට මේකෙන් සහතික කරලා දීලා අපි කියනවා ලඟ එක්කෙනා ගන්න කියලා. මේකෙන් ඔක්කෝම ටික දාලා, මොනවා මොනවා හරි ජිල්මාට් ටිකක් දාලා පුළුවන් එක්කෙනා වැඩේ කරගන්නවා. ලඟපාත ඉන්න ඉස්කෝලෙට අල්ලපු වැටේ ඉන්න මිනිහාට මේක හදාගන්න බැරි වෙනවා. ඒ වගේම මේකේ තියනවා තව තැනක නීත්‍යානුකූල නොවෙන හෝ ව්‍යාජ ලේඛණයක් වන්නේ නම් ඉඩමේ අයිතියට අදාළ එක ඒකේ ලකුණු කැපෙනවා කියලා. ව්‍යාජ ලේඛණයක් නම් ලකුණු කැපෙන්න ඕන, ඒකේ ගැටළුවක් නෑ. හැබැයි නීත්‍යානුකූල නොවෙන කියන එකෙන් අදහස් වෙන්නේ අපි දන්නවා අහිංසක මිනිස්සු ඉන්නවා අර මම ඉස්සෙල්ලා කිව්ව පැබොටුවේ ඉස්කෝලෙට ඇතුළත් කරගන්න බැරි වෙච්ච දරුවා අවුරුදු 40 ක් ඉස්කෝලේ ඉස්සරහා පදිංචිය. හැබැයි ඉඩමේ කිසිම අයිතියක් නෑ. හැබැයි ඉඩමේ අයිතිය නැති හින්දා ලකුණු 10 ක් කැපෙනවා. ඒ නිසා ඒ දරුවාට ඉස්කෝලේ ඉස්සරහා තියන, ලොකු ඉස්කෝලෙකට නෙමෙයි. පැබොටුවේ ඉස්කෝලෙට ඇතුළත් වෙන්න බැරි වෙන්නේ. ඒ නිසා මේක මේ නීත්‍යානුකූල නොවන කියන එක අයින් කරලා පදිංචිය සනාථ කරනවා නම්, ඒ ග්‍රාම නිළධාරී විසින් පදිංචිය සනාථ කරනවා නම්, ඡන්ද හිමි නාම ලේඛණයේ නම තියනවා නම් ඒක පදිංචිය හැටියට සැළකිය යුතුයි කියලා වෙනස් කරන්න ඕන කියන යෝජනාව මේ ගරු සභාවට මම ගේනවා.

ඒ වගේම තමයි ලඟම පාසැල්වලට ලකුණු කපනකොට අහස් දුර ගණනය කරනවා. අහස් දුර ගණනය කරලා අපි ඉඟිලිලා ද යන්නේ. අපි චොපර් එකෙන් ද යන්නේ ? නැහැනේ. අපි යන්නේ පාරේ කොහේ හරි වංගු ටිකකින් ගිහිල්ලා. එහෙම නම් පාරේ වාහනයක් යන්න තියන දුර ගණනය කිරීමයි සුදුසු විදහට අපි මේක වෙනස් කරන්න ඕන කියන යෝජනාව මම ගේන්නේ. ඒ වගේම මම නැවත කියනවා පදිංචිය සනාථ කිරීමට අදාළ ලිපි ලේඛණවලට අදාළ සියළුම ලකුණු ඡන්ද හිමි නාම ලේඛණයේ තියනවා නම් ඒකට ගලපලා ලකුණු දීම සුදුසුයි කියලා අපි පළාත් සභාව විදිහට මේ යෝජනාවේ වෙනස් කරන්න ඕන කියන මතය මම අරගෙන එනවා. එතකොට පදිංචිය අපට තහවුරු කරන්න වෙන්නේ ඒ විදිහට. එහෙම නැතුව නැති බැරි අහිංසක මිනිස්සුන්ට තමයි හැම තැනම මේ ප්‍රශ්නය වෙන්නේ. හදීසි ආපදාවක් වුනාම ඉඩම තියන මිනිහාට ඒක හම්බ වෙනවා. ඊළඟට සෙවිලි තහඩු ටිකක්, වෙන මොනවා හරි ආධාරයක් දෙන්න ගිහාම ඒකත් ඉඩමේ අයිතිය නැති වුනාම නැති වෙනවා. ළමයා ඉස්කෝලේ දාගන්න ගිහාම ඉඩමේ අයිතිය නැති හින්දා නැති වෙනවා. මේ නැති වෙන්නේ කාටවත් නෙමෙයි අපේ රටේ ඉන්න අන්ත පීඩිත, අන්ත දුගී, අසරණම මිනිස්සුට තමයි මේ අසාධාරණය දිගින් දිගටම වෙන්නේ. ඒ හින්දා මේක තවදුරටත් අපේ පළාත් සභාව තුළ නොවෙන විදිහට මේක වෙනස් කරන්න ඕන කියන යෝජනාව මේ ගරු සභාවට මම මේ වෙලාවේ ඉදිරිපත් කරනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙවැනි යෝජනා වෙනස් කිරීමට අවශ්‍ය ඒවා තවත් මේකේ තියනවා. හැබැයි මම හිතනවා ඒ සියල්ල මේ වෙලාවේ කථා නොකළාට අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා පසුගිය අධ්‍යාපන උපදේශක කාරක සභාවේ දී මාත්

ඇතුළු අපි කණ්ඩායමක් යෝජනා ප්‍රති නිර්මාණය කිරීම සඳහා සබරගමුව පළාත් සභාවට ගැලපෙන විදිහට ඒ සඳහා කමිටුවක් පත් කළා. ඒ නිසා ඒකෙදී අපි මේවා නැවතත් හොඳට බලලා අපේ පළාත් සභාවට අවශ්‍ය විදිහට මේවා සකස් කරනකොට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ නිසා අද මේ යෝජනාව අරගෙන එනකොට මේක ගේන්නේ කිසිම දේශපාලන මතයකින්, පක්ෂ මතයකින්, ආණ්ඩු පක්ෂ විපක්ෂ කියන අදහසකින් නෙමෙයි මේ රටේ දරුවන්ට, රටේ දෙමව්පියන්ට, පළාතේ දූ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් ඉටුවිය යුතු කාරණාවක් මම නැවත සිහිපත් කරනවා. මම දන්න විදිහට 1000 ක් විතර ප්‍රමාණයක් මේ දිස්ත්‍රික්කයේ පළවෙනි වසරට දරුවා ඉස්කෝලේ නොයවා තවම ගෙදර තියාගෙන ඉන්නවා. ඒ නිසා මේක වෙලා තියෙන්නේ මේ චක්‍රලේඛයේ වැරැද්දෙන්. මට නම් වශයෙන් ගෙනල්ලා දෙන්න පුළුවන් 70 ක් විතර, මගේ ගෙදර තියන ලේඛණවල තියනවා. ඒකෙන් 50 කට විතර මම ලිපි ලබාදීලා තියනවා අධ්‍යාපන ලේකම්තුමා මුණගැහෙන්න. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ යෝජනාව සබරගමුව පළාත සඳහා මහා ආණ්ඩුවේ ඉසුරුපායෙන් එවපු පළමු වසරට සිසුන් බඳවා ගැනීමේ චක්‍රලේඛය වෙනුවට සබරගමුව පළාත් සභාව සඳහා වෙනම අපේ පළාතට අදාළ පාසැල්වලට මේකේ අදාළ නොවන කොටස් ඉවත් කරලා ඒවාට ගැලපෙන විදිහට මේක සංශෝධනය කරගන්න අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස ඉල්ලා සිටිමින්, ඔබට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ස්තුතියි ගරු රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමාට. මීළඟට ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක් ගරු මන්ත්‍රීතුමා. එතුමා සභාවේ නැහැ. මීළඟට ගරු මන්ත්‍රී නිමල් විජේනායක ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී නිමල් විජේනායක*
*கௌரவ உறுப்பினர் நிமல் விஜேநாயக* *Hon.Member Nimal Wijenayaka*

----------------------------------------

ස්තුතියි ගරු සභාපතිතුමනි. රම්‍යකුමාර අපේ හිතවත් මන්ත්‍රීතුමා කාලීන ප්‍රශ්නයකට අදාල යෝජනාවක් ඉදිරිපත් කලේ. මේ ප්‍රශ්නය ගැන අපි දෙයාකාරයෙන් දකින්න පුළුවන්. එතුමාට එකඟව කතා කරනවා නම් මං හිතන්නේ ඇහැලියගොඩ මැතිවරණ කොට්ඨාශයේත් අපිට බරපතල ප්‍රශ්නයක් තිබෙනවා. ඇහැලියගොඩ ප්‍රාථමිකය,කිරිඇල්ල ප්‍රාථමිකය මේ ප්‍රදේශවලට පෝෂිත කලාපය තුළ ජීවත් වෙන දෙමව්පියන්ගේ දරුවන්ට අද ඒ පාසැල් වලට ඇතුළත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තියෙනවා. ඒ අනුව මම එකඟ වෙනවා. ඔබතුමා මේ ඉදිරිපත් කරපු ප්‍රශ්නය ගැන. මං හිතන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය මේ ප්‍රශ්නය ගැන දකින්න ඇත්තේ වෙනත් ආකාරයෙන්. ඔබතුමා ඒ ගැන සඳහන් කළා. අපි දන්නවා රත්නපුර දිස්ත්‍රික්කයේ සමහර ගම්මානවල පාසැල් වැහීගෙන යන තත්ත්වයක් තියෙනවා. ඒ වැසීගෙන යන තත්ත්වයට විසඳුමක් හැටියට වෙන්නට ඇති මේ ළමුන් සීමා කරලා ජනප්‍රිය පාසැල් වලට ළමුන් සීමා කිරීම තුළින් තමන් ජීවත් වෙන අසල්වැසි පාසැල් වලට දරුවන් ඇතුළත් කර ගැනීමට අවස්ථාවක් බලහත්කාරයෙන් වගේ දරුවන් ඇතුළත් කිරීමට වෙනවා. නමුත් ඒකටත් ඔබතුමා උත්තරය පැහැදිලි කලා. එතෙන්දී ඒකට මම එකඟ වෙනවා. ඔබතුමා පැහැදිලි කළා දුප්පත් අහිංසක ජනප්‍රිය පාසැල් වලට යවා ගන්න බැරි දරුවෝ තමයි

අවසානයට මේ පාසැල් වලට ඉතුරු වෙන්නේ. ඒකටත් මම එකඟ වෙනවා. අපි හැමෝම හැම දෙමව්පියෙක්ම බලාපොරොත්තු වෙන්නේ තමන්ගේ දරුවා තමන් ඉන්න තත්ත්වයට වඩා ඉහළ සමාජයකට හුරු පුරුදු කරලා ඊට වඩා ඉහළට හොඳ අධ්‍යාපනයක් ලබාදීලා ඒ කටයුතු කරන්නට තමයි. ඒ නිසා මම ඒකටත් එකඟ වෙනවා. නමුත් ගරු සභාපතිතුමනි අපි දන්නවා අද අධ්‍යාපන ඇමතිතුමාටත් යොමු කරන්න කැමතියි අවධානය යොමු කරන්න කියලා. අද සමාජය ජනගහනය බොහොම වේගයෙන් වැඩි වෙනවා. මං හිතන්නේ පාසැලක පංති ප්‍රමාණය වැඩි කිරීම තුළින් පමණක් මේ ප්‍රශ්නය විසඳුමක් ලබා ගන්න බෑ. මම අවුරුදු 25 කට ආසන්න ප්‍රමාණයක් වෙනවා දැන් පළාත් සභාවට ඇවිල්ලා. මම අහනවා අපිට පළාත් සභාවක් හැටියට හෝ නැත්නම් රජයක් හැටියට සෑම රජයකම මේ පසුගිය කාලය තුළ පාසැල් අලුතින් ආරම්භ වෙලා නෑ. ඇත්තටම ඒක කණගාටුදායක කාරණාවක්. මට මතකයි මම මගේ පවුල ගැන කියනවා නෙමෙයි. මට අවුරුදු දහයේදී පමණ මගේ තාත්තා විජේනායක විද්‍යාලය කියලා ඉස්කෝලයක් හැදුවා අපේ ගමේ. ඉඩම් මිළදී අරගෙන . එතුමාගේ සියළුම ධන පරිත්‍යාගයෙන් පාසැලක් හැදුවා. බොහොම හොඳින් විජේනායක විද්‍යාලය කියන එක පවත්වාගෙන යනවා. මම දන්නවා සමිත ආටිගල මන්ත්‍රීතුමාගේ පරම්පරාව ඉඩම් පරිත්‍යාග කරලා පාසැල් ආරම්භ කරලා මේ රත්නපුර ප්‍රදේශයේ ආරම්භ කලා. රජයක් හැටියට මම පසුගිය අයවැයේදීත් කිව්වා ඇහැලියගොඩ ප්‍රදේශයේ නිමල් වික්‍රමසිංහ මැතිතුමාගේ ලොකු බලාපොරොත්තුවක් තිබුණා සිරිසමන් විද්‍යාලය කාන්තා බාලිකා විද්‍යාලයක් අලුතින් ආරම්භ කරන්න. එවැනි වැඩ සටහන් වලට අපි යායුතුයි මේ ප්‍රශ්නයට විසඳුම් ලබා දෙන්න. ඒ නිසා ඔබතුමාගේ ප්‍රශ්නයට අවධානය යොමු කරනවා අධ්‍යාපන ඇමතිවරයා විදිහට අලුතින් පාසැල් ආරම්භ කරන්නේ නැතුව මේ ගැටළුවට කවදාකවත්. ලොකු තදබදයක් තියෙනවා ඇහැලියගොඩ ප්‍රදේශයේ අපි දැනෙන ප්‍රශ්නයක් මේක. මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මධ්‍යම රජයත් එක්ක කතා කරන්න රේඛීය අමාත්‍යාංශයත් එක්ක කතා කරන්න. මම මෑතකදී සති දෙකකට උඩදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා හමු වෙන්න අවස්ථාවක් ලැබුණා. ඇහැලියගොඩ මධ්‍ය මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය සමග. එතුමා කියන්නේ ලමුන් ඇතුලත් කර ගන්න සාකච්ඡා කරන්න ගිය අවස්ථාවේ අලුතින් පාසැල් ආරම්භ කරන්න කියලා අපිට එතුමා උපදෙස් ලබා දුන්නා . ඒක තමයි සම්පූර්ණ සහයෝගය ලබා දෙන එක. ඒ ගැන අවධානය යොමු කරන්න කියලා මම මේ අවස්ථාවේදී මතක් කරනවා. මම හිතන්නේ ගරු රම්‍යකුමාර මන්ත්‍රීතුමා තුළ තවත් බලාපොරොත්තුවක් ඇති ලමුන් සීමා කිරීම තුළින් ගුණාත්මකව ඒ ගුරුවරුන්ට ඒ පහසුකම ලබාදීලා ලමුන්ට හොඳ අධ්‍යාපනය ලබාදීමේ අරමුණක් වෙන්නට ඇති. නමුත් ඒවා කරන්න යෑමේදී ඔබතුමා ප්‍රකාශ කළ පරිදි පංති වැඩි විය යුතුයි. වැඩි වෙන කොට අවශ්‍ය ගුරුවරුන් ලබා දිය යුතුයි. ඒ පංති කාමර ලබාදිය යුතුයි. ඒ අවශ්‍ය සියළුම යටිතල පහසුකම් හා සියළුම දේ ලබාදීම කළ යුතු වෙනවා. මේ නීති අන පනත් ගේන්න කලින් මේ චක්‍ර ලේඛණ හඳුන්වලා දීලා තියෙනවා. තවත් අවුරුදු දෙකක් ඉස්සරහට ඒවා සැලසුම් කරලා මේවා ක්‍රියාත්මක ළා නම් මං හිතන්නේ ඒ පහසුකම ලබාදීලා ඒ චක්‍ර ලේඛණ ගෙනල්ලා මේවා ක්‍රියාත්මක කළා නම් මේවා සාර්ථක වෙන්න ඒවගේම ගැටළු වලට මුහුණ දෙන්නේ නැති තත්ත්වයක් උදා වෙනවා කියන එක මගේ හැඟීමයි. ඒ අනුව කෙසේ වෙතත් ඔබතුමා මේ කාලීන ප්‍රශ්නයක් මේ මතු කරලා තියෙන්නේ මම ඒකට ඔබතුමාට සහයෝගය ලබා දෙමින් මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ස්තූතියි ගරු නිමල් විජේනායක ගරු මන්ත්‍රීතුමාට. මීළඟට ගරු මන්ත්‍රී යෙහෙයියා එම්.ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*

--------------------------------------------

ගරු සභාපතිතුමනි ප්‍රථමයෙන්ම රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී එක පැත්තකින් වැදගත් වෙනවා වගේම තව පැත්තකින් අපිට ජ්‍යෙෂ්ඨාධිකරණයට අභියෝග කිරීමේ හැකියාවක් අපි කිසි කෙනෙකුට නෑ ගරු සභාපතිතුමනි. මේ තත්ත්වය දිහා බැලුවහම ගරු සභාපතිතුමනි ලමුන් පලමු වසරට ඇතුලත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ජ්‍යෙෂ්ඨාධිකරණ නියෝගයක් තිබෙනවා ලමුන් 35 දක්වා සීමා කළ යුතුයි කියන ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය ඉන් අනතුරුව තමයි ලමුන් 35 දක්වා සීමාව අධිකරණයට මේ තියෙන ගැටළු සම්බන්ධයෙන් දැනුවත් කරලා ලමුන් 40 ක් බඳවා ගෙන වාර්ෂිකව එක් එක් අවුරුද්දේ එක් එක් ළමයා අඩු කරගෙන මේ අවුරුද්දේ 38 යි. ඒ විදිහට 2020 දක්වා මේකේ ලමුන් 35 දක්වා අඩු කිරීමේ වැඩ සටහන නිර්දේශ කරලා තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය. නමුත් අපේ රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා කියන ගැටළුව ගත්තහම මේ සියළු ගැටළු අපිට මතු වෙලා තියෙන්නේ නාගරීකරණ ප්‍රදේශවල තමයි ගරු සභාපතිතුමනි වැඩියෙන්ම අපිට මේකට මුහුණ දෙන්න වෙලා තියෙන්නේ. ගම්බද ගත්තහම සීමිත ප්‍රමාණයක් මේකට මුහුණ දුන්නත් අසීමිත ප්‍රමාණයක් අපි ලක් වෙලා තියෙන්නේ නගරබද . මොකද එදා අපේ දරුවෝ ගත්තහම දෙමව්පියෝ වැඩි අධ්‍යාපනයක් ගැන හිතුවේ නෑ. අපේ දෙමව්පියෝ ඉඩ කඩම් යාන වාහන විවිධ දේවල් ලබා දෙන්න කටයුතු කළත් අද බහුතරයකට ඒක නෑ. අද සෑම දෙමව්පියෙක්ම කල්පනා කරන්නේ මගේ දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දුන්නොත් ඒවගේම මගේ දරුවාට හොඳ පාසැලක් ජනප්‍රිය පාසැලකට ගියහම මගේ දරුවාට අනාගතය සාර්ථක කරගෙන ඉහළට යන්න පුළුවන් කියලා විශ්වාස කරනවා. නමුත් ඒක මිථ්‍යාවක් ගරු සභාපතිතුමනි. මම එහෙම කියන්න හේතුව තමයි අපි එහෙම හිතලා එහෙම කෙරුවාට අපි ගත්තහම පහේ ශිෂ්‍යවය සාමාන්‍ය පෙළ උසස් පෙළ ප්‍රතිඵල ගත්තහම වැඩියෙන්ම සමත් වෙන්නේ ගම්බද අතිදුෂ්කර පාසැල් පවා ඉහළම සාමාර්ථය ලබපු අවස්ථාවල් අපි දැකලා තියෙනවා. ක්‍රියාත්මක වෙලා තියෙනවා. ඒක ප්‍රායෝගිකව අපි ක්‍රියාත්මක වෙමින් පවතින සිද්ධියක්. නමුත් අපේ රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා කියපු එක එකහෙලාම අනුමත කරනවා එතුමා ලමුන් තාමත් පාසැල් නොයා ගෙදර ඉන්නවා කිව්වොත් ඒක සත්‍යයක්. ඒක මක් නිසාද කිව්වොත් විවිධ හේතූන් මත ආසන්නම පදිංචිකරුවන්ට අවස්ථාව නොලැබී විවිධ උපක්‍රමශීලීව විවිධ අය වෙලාසනින් පෙර සූදානම් වෙලා ආසන්න පදිංචිකරුවන් වශයෙන් සකස් කරගෙන තමන්ගේ දරුවා පාසැල් වලට ඇතුලත් කර ගැනීමේ වැඩ සටහන් අපි ක්‍රියාත්මක වෙනවා.

ඊළඟට අපේ නිමල් විජේනායක ගරු මන්ත්‍රීතුමා කියපු විදිහට ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලය. එක අවස්ථාවක අපි පංති කාමර දහයක් තිබුණා. ඊට පස්සේ හයකට අඩු කරලා.

දැන් අටකට ගෙනල්ලා. ඒවගේ විවිධ ප්‍රශ්න තියෙනවා. එදා 40,45,50 දක්වා ළමුන් අද පංති කාමරය තුළ සීමාවීම තුළින් ගැටළුවක් මතු වෙලා තියෙනවා. සමාන්තර පංති අවශ්‍යතාවය මත නගරබද පාසැල්වල ඒවගේම අත්‍යාවශ්‍ය පාසැල්වල මේක සමාන්තර පංති ඇති කිරීම තුළින් අපේ ඇමතිතුමාට ව්‍යුහ කමිටුක් තුළින් ලැබිලා. මේ ඉල්ලීම තුළින් මේකට කටයුතු කිරීම තුළින් අමාත්‍යාංශ ලේකම්තුමා හරහා කටයුතු කරන්න පුළුවන්. නමුත් එකක් ගරු සභාපතිතුමනි මම දකින දෙයක් තමයි අපේ රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා කියන විදිහටම යම් යම් ඡේද ඉවත් කිරීම ක්‍රියාත්මක කළොත් ඒකේ මම එකක් දකිනවා. නිවසේ ඉඩම් මේ නගර සභා සීමාව තුළ ගත්තහම ගරු සභාපතිතුමනි ඉඩම් දාහකට වැඩි කොටසක් තිබෙන්නේ රජය සතු ඉඩම්. ඒවාට කෙලින්ම ගත්තහම ඔප්පු නෑ. එවැනි අවස්ථාවකදී ගන්න පුළුවන්කමකුත් නෑ. ඒගොල්ලෝ ජීවිත කාලයේම පදිංචි වෙලා ඉන්නේ ඒ නිවසේ. ආසන්නම පදිංචිකරුවෝ. නමුත් ඔවුන්ට යම් සහනයක් සලසා දිය යුතුයි. පැහැදිලිවම ගත්තහම ආසන්නම අසාධාරණයට ලක් වෙලා ඉන්නේ අර නගරබද ඉන්න පාසැලට පදිංචි වෙලා ඉන්න අඩුම ගානේ සීනුව නාද වෙන ඇහෙන තැන හිටියත් ඔහුට අසාධාරණය වෙනවා. එවැනි අයට සාධාරණයක් කරන්න ක්‍රමවේදයක් අපි අනුගමනය කරන්න ඕනේ. ඒවගේම මේ වෙන කොට දකිනවා සමහර දරුවන්ට ගරු සභාපතිතුමනි පාසැල් නැතුව තාමත් ගෙදර ඉන්නවා. අද අපේ රජයේ පළාත් සභාවේ සියළු දෙනාගේ වගකීමක් තමයි අවුරුදු 13 ක් ඒ දරුවාට අධ්‍යාපනය ලබාදීමේ වගකීම තිබෙනවා. කිසිම කෙනෙකුට ගෙදර ඉන්න පුළුවන් තත්ත්වයක් නෑ. නමුත් එවැනි දරුවෝ අද ගෙදර ඉන්න කොට අපේ පළාත් ඇමතිතුමාට ඒවගේම ලේකම්තුමාට ඒවගේම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාලාගේ වගකීම යුතුකම තමයි ඔවුන් සඳහා පාසැල් ලබාදීම. ඉතිං ඒ වැඩ පිළිවෙල අපි කළ යුතුයි. නමුත් මේ සඳහා සමාන්තර පංති ගැන කතා කරන්න පුළුවන්. සමාන්තර පංති ගැන කතා කරන කොට ඉඩ පහසුකම් ගැන කතා කරන්න පුළුවන්. ඉන් අනතුරුව ගුරුවරුන්ගේ අඩුපාඩුකම් ගැන කතා කරන්න පුළුවන්. එකින්නෙක එකින්නෙක කතා කරන කොට විවිධ ගැටළු සහ භාධක මේකට එන්නට පුළුවන්. ඒ මොනවා ආවත් අපේ පරමාර්ථය අපේ චේතනාව අධ්‍යාපනය නම් ඒක ගොඩනැගීම වැදගත්. අපි දකිනවා අපේ අධ්‍යාපන ඇමතිතුමා අමාත්‍යාංශ ලේකම්තුමා අධ්‍යාපනය සම්බන්ධයෙන් කටයුතු කරන අධ්‍යක්ෂකවරු වැඩියෙන්ම මහන්සි වෙලා පහුගිය කාල පරිච්ඡේදය තුළ අපේ සබරගමුව ඉහළ මට්ටමක එන්න පුළුවන් අවස්ථා උදා කරලා තියෙනවා. ඒක අපි ගරු කළ යුතුයි. ඒකත් ගුණාත්මකභාවය නිසා ඒවගේම මේ සඳහා සොයා බැලීම නිසා ඒවගේම මේ සඳහා ක්‍රියාත්මක කරපු ක්‍රියාදාමය නිසා තමයි මේ සියල්ල සිද්ධ වෙන්නේ. අපි කිසි දවසක මේ මොන අඩුපාඩු තිබුණත් අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉහළට එන කොට ඒකේ ගෞරවය ඔබතුමාට අපිට මේ ප්‍රදේශයේ ජීවත් වෙන මේ සම්බන්යෙන් කටයුතු කරන කොට නිළධාරීන්ට සහ ජනතාවට ලැබෙන කොට ලොකු සතුටක් තියෙනවා. ඒක නිසා මේක ගැන ක්‍රියාත්මක කරන කොට ශ්‍රේෂ්ඨාධිකරණය සහ ළඟම පාසැල හොඳම පාසැල වර්තමාන රජයේ අධ්‍යාපන වැඩ සටහනත් එක්ක පළාත් සභාව සමගාමීව යනවා. ඒවගේම පළාත් සභාව පූර්ණ සහයෝගය ලබා දෙනවා. ක්‍රියාත්මක වෙනවා. එවැනි අවස්ථාවකදී ග්‍රාමීය පාසැල් ගොඩ නැගිය යුතුයි . ඒවගේම මේ වගේ ප්‍රශ්න එක කොට ඒ සඳහා සමාන්තර පංති හෝ ලබාදීලා යම්කිසි වැඩ පිළිවෙලක් ඇති කරලා සියළු දරුවන්ට අධ්‍යාපනය ලබාදීලා යන්න පුළුවන් වැඩ

සටහනක් ලබාදිය යුතුයි. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධයෙන් සොයලා බලලා අධිකරණයට අපහාසයක් නොවන විදිහට රේඛීය අමාත්‍යාංශයට හා පළාත් සභාවත් අතර ගැටීමක් ඇති නොවන විදිහට පළාතේ සංවර්ධනයට දියුණුවට ඒවගේම අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ වැඩ සටහනට සියළු දෙනාට සමාන්තරව අධ්‍යාපනය ලබාදීමේ ලබාදීමේ යුතුකම වගකීම ඉටු කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලමින් ඔබතුමා මට අවස්ථාව සලසාදීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ගරු යෙහෙයියා එම්.ඉෆ්ලාර් මන්ත්‍රීතුමනි. මීළඟට ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව එතුමා නම් සභාවේ නෑ. බොහොම පුන පුනා ඉදිරිපත් කරපු යෝජනාවක්. අපි විශේෂයෙන්ම මතක් කරන්නට ඕනේ පළමුවෙන්ම ඉෆ්ලාර් මන්ත්‍රීතුමා මතක් කළා වගේ මේක අධිකරණය ගත්තු තීන්දුවක්. ඒවගේම පළාතට විතරක් වෙන් කරන්න පුළුවන් චක්‍ර ලේඛණයක් සකස් කරන්න පුළුවන්ද කියන එකත් ප්‍රශ්නයක්. දෙවෙනි කාරණාව සමහර පාසැල්වල මේ තත්ත්වය ඔය කියන ආකාරයෙන්ම උද්ගත වෙලා තියෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත් ගොඩකවෙල ප්‍රදේශයේ දැන් පොල්ගහවත්ත විද්‍යාලය වැහෙන්න තත්ත්වයට පත් වෙනවා. ප්‍රාථමිකයේත් ළමයි හය දෙනෙක් හත් දෙනෙක් විතර ඉන්නවා. උතුම් මොල්ලිගොඩ විද්‍යාලයේ ඉන්නේ ප්‍රාථමිකයේ ළමයි දෙන්නයි. ඒ දෙන්නත් ඉන්නකන් කර ගත්තොත් ඉස්කෝලයේ අවුරුදු තුනකින් ඉස්කෝලය ඉවරයි. ඒවගේම පින්නකන්ද විද්‍යාලයේ ඉන්නේ ළමයි විසි ගණනයි . දැන් බලවින්න විද්‍යාලයේ ඔය ප්‍රශ්නය එන්නේ නෑ මේ හැම තැනින්ම ළමයි ගන්නේ. හැබැයි ගොඩකවෙල ප්‍රාථමිකය ගත්තහම ළමයි 347 ක් ගොඩකවෙල ප්‍රදේශයේ උපත් අනුපාතය ගත්තහම උපත් ප්‍රමාණය ගත්තහම 94 යි. එතකොට මේ ළමයි කොහෙන්ද ගෙනල්ලා තියෙන්නේ. මේදේම පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ගොඩකවෙල ප්‍රදේශයේ ඇති වෙච්ච් පොඩි ප්‍රශ්නයකදී ප්‍රශ්නය ඔබතුමාලාට මතක ඇති. පාර වහලා පැය ගාණක් තිබුණා. හයේ පංතියට සිසුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රශ්නයේදී. අපි ලොකු සියළු දේශපාලන කණ්ඩායම් එකතු වෙලා අධ්‍යාපන බලධාරින් එකතු වෙලා ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සාකච්ඡාවක් තිබ්බා. දැන් මේ ප්‍රශ්නය අවුරුදු පහකට හයකට පස්සේ ගොඩකවෙල මධ්‍ය මහා විද්‍යාලයටත් ජාතික පාසැලටත් මුහුණ පාන්න සිදු වුණා. හැබැයි දැනට අවුරුදු හයට ඉස්සර වෙලා ප්‍රාථමික විද්‍යාලයේ ඇති වෙච්චි ප්‍රශ්නයක් තමයි මේ මුහුණ

පාන්න සිද්ධ වුනේ අර විදුහල්පතිවරු දෙදෙනාට. ඒ අවස්ථාවේදී ගරු සභාපතිතුමනි අපිට හොඳට අධ්‍යයනය කරන්න ලැබිච්චි දෙයක් තමයි උදාහරණයක් හැටියට වේරහැල විද්‍යාලය ගත්තොත් වේරහැල විද්‍යාලයේ ගණිත ගුරුවරිය අවුරුදු 32 ක් වෙනවා ඇයට. ඒ විදුහල්පතිතුමා නැගිටලා කිව්වා අවුරුදු 32 ක් මේ ගණිත ගුරුවරිය ඉන්නවා එකම ළමයෙක්වත් ගණිතය පාස් කරන්නේ නෑ. නියන්ගම විද්‍යාලයේ ගුරුවරියක් ඉන්නවා අවුරුදු 25 ක් ඒ විද්‍යාලයේ ඒ ගුරුවරිය ඉන්නවා. ඒ විද්‍යාලයේ ප්‍රතිඵලයත් එහෙමයි. එතකොට තමන්ගේ ළමයා හොඳම පාසැලක ඇතුළත් කර ගැනීම දෙමව්පියන්ගේ වගකීමක්. අපිත් මෙහෙම හිටියාට අපේ ළමයිනුත් රටේ තියෙන ඉහළ පාසැලක ඉගෙන ගන්නේ .ග්‍රාමීය පාසැල් ගැන කතා කළාට. අපිට අයිතියක් තියෙනවා ඕනම දෙමව්පියෙකුට තමන්ගේ දරුවා ඉතාම හොඳ තමන්ට වියදම් කරන්න පුළුවන් ඉතාම හොඳ පාසැලකට තමන්ගේ දරුවා ඇතුලත් කර ගැනීමට. එතකොට දෙමව්පියන් අතර මතයක් තිබෙනවා ගමේ ඉස්කෝලයට මේ ළමයා දාලා වැඩක් නෑ. ගමේ ඉස්කෝලයේ අධ්‍යාපනය බොහොම පහළ මට්ටමක තියෙන්නේ. ඒ නිසා පුළුවන් විද්‍යාලයකට හොඳ විද්‍යාලයකට නමක් තියෙන විද්‍යාලයකට මේ ළමයා ඇතුලත් කර ගන්නට. අන්න ඒ උඩ අද විශාල වශයෙන් ගොඩකවෙල ප්‍රාථමිකය තුළ ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තියෙනවා ළමයින් ඇතුලත් කර ගැනීමට. මේ වනවිට කෝම්පිටිය විද්‍යාලය වැහිලා. ළමයි නෑ. ඒ ළමයි ඔක්කෝම ප්‍රාථමික විද්‍යාලයට ගන්නවා. ඒවගේම පල්ලේකන්ද විද්‍යාලය ඔන්න මෙන්න වැහෙන්න. මාවතලන්ද විද්‍යාලය වැහිලා ඉවරයි. ඔබතුමා දන්නවා සභාපතිතුමා එක්ක. යහලවල විද්‍යාලය වැහෙන්න යනවා. ඇයි මේ ළමයි ටික ඔක්කෝම ප්‍රාථමික විද්‍යාලයට ගන්නවා. දෙමව්පියෝ මොනවා හරි බොරුවක් කරලා සමහර දෙමව්පියෝ ඉන්නවා ටවුන් එකේ කඩයක් කුළියට ගන්නවා. කුළියට අරගෙන ග්‍රාම සේවක මහත්තයා අල්ලගෙන ඒකේ පදිංචිය හදා ගන්නවා. හැබැයි ඉන්නේ රංවල නැත්නම් වැලිගෙපොල නැත්නම් අම්බැවිල නැත්නම් වෙළපොළ දිහාවේ පදිංචි. හැබැයි ග්‍රාම සේවක මහත්තයා අල්ලගෙන ඡන්දය ලියා ගන්නවා අර කඩේට. මේ මොකද ප්‍රධාන වශයෙන් ළමයා ඇතුළත් කර ගන්නට. මේක සිද්ධ වෙලා තියෙන්නේ පැහැදිලිවම මේ පාසැලේ ගුරුවරු හොඳයි. මේ පාසැලේ භෞතික පරිසරය හොඳයි කියන මතය දෙමව්පියෝ අතරට ගිහිල්ලා තියෙනවා. එහෙම නම් මේක කඩන්නේ නැතුව මේක වෙනස් කරන්නේ නැතුව අවට පාසැල්වල භෞතික තත්ත්වය සංවර්ධනය කරන්නේ නැතුව ගුණාත්මක තත්ත්වය සංවර්ධනය කරන්නේ නැතුව මේ චක්‍රලේඛණ වෙනස් කරලා මේකට විසඳුමක් ගන්න හම්බ වෙන්නේ නෑ කිසි දවසක. ඒ චක්‍රලේඛ වෙනස් කරලා ළමයි ඇතුළත් කර ගැනීමට අවස්ථාව දුන්නොත් අර ගම්වල තියෙන පාසැල් පද්ධතිය සම්පූර්ණයෙන්ම තව අවුරුදු පහක් හයක් යන කොට අක්‍රිය වෙලා වෙනස් වෙලා යනවා. ඒ නිසා ඒ තත්ත්වය ආරක්ෂා කර ගන්න හොඳ යෝජනාවක් තමයි තියෙන්නේ. ළඟම පාසැල හොඳම පාසැල බවට පරිවර්තනය කරන්න. ඒකට අවශ්‍ය භෞතික තත්ත්වය සම්පත් වැඩි කරන්න අවශ්‍ය මුදල් ටික දිලා තියෙනවා. අපි දන්නවා පනාවල විද්‍යාලයට අමාත්‍යාංශය හරහා හත් ලක්ෂ අනූ දාහක් දීලා තියෙනවා අවශ්‍ය කරන වැසිකිලි කැසිකිලි පද්ධතිය දියුණු කරන්න. විදුහල්පතිතුමා මේකේ සල්ලි ටික සාක්කුවේ දාගෙන දෙලක්ෂ පනස්දාහක් ඒ වැඩේ කරන්නේ නැතුව අතරමඟ දාලා තියෙනවා. එහෙම තැනුත් තියෙනවා. ඒ විදුහල්පතිතුමා ගැන ගරු අධ්‍යාපන ඇමතිතුමාට විශේෂයෙන් මම මතක් කරනවා පනාවල විද්‍යාලයේ විදුහල්පතිතුමා ගැන විශේෂයෙන් හොයන්න. ඒ ප්‍රාථමික ළමයිට ඉගෙන ගන්න තැනක් නෑ. ඒ ළමයි එනවා නම්

එන්න ඕනේ මාදම්පේට. කිලෝමීටර් හතරක් විතර දුර ගෙවාගෙන . එහෙම නැත්නම් ගොඩකවෙලට යන්න ඕනේ. අද ඒ ඉස්කෝලයේ තත්ත්වය සම්පූර්ණයෙන්ම විදුහල්පතිතුමා පනාවල විද්‍යාලයේ පහුගිය දවසක ගරු සභාපතිතුමනි ට්‍රිප් එකක් යන්න කියලා ළමයින්ගෙන් සල්ලි එකතු කරගෙන රු.1500/- ගානේ අරගෙන හෙට උදේ යන්නේ කියලා රාත්‍රී නවයට විතර ගෙවල් වලට ටෙලිෆෝන් කරලා කියනවලු අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් යන්න එපා කියලා තහනම් කෙරුවා ඒක නිසා යන්න විදිහක් නෑ කියලා . රු.1500/- ගානේ ගෙවලා ළමයි 48 දෙනෙක්. අධ්‍යාපන කාර්යාලයෙන් මේ කතා කරලා කිව්වා අවසරය හරි නෑ දෙමව්පියෝ කීප දෙනෙක් විරුද්ධ වුණා කියලා මේ ගමන හෙට උදේ යන්නේ නෑ කියලා එතකොට ඒ සල්ලි අරගෙන දෙමව්පියන්ගේ. මෙවැනි විදුහල්පතිවරුත් ඉන්නවා. මෙවැනි විදුහල්පතිවරු ඉන්න පාසැල්වල තමන්ගේ පාසැල්වල හොඳට නඩත්තු කරන්නේ නැති පාසැල්වල ඒවගේම අරක් අරගෙන ගුරුවරු ඉන්න පාසැල්වල ඒ ගුණාත්මක තත්ත්වය ඉහළට ගන්න පුළුවන්කමක් නෑ. අපි බොහොම අමාරුවෙන් නගරයේ පාසැලකට අපේ ළමයෙක් දැම්මහම අපි බැලුවොත් එහෙම ශිෂ්‍යත්ව ප්‍රතිඵලය කොහොමද කියලා ඒ ශිෂ්‍යත්ව ප්‍රතිඵලය ඉඳගන්න ළමයි ගාන බැලුවහම 350 ,400 න් පාස් වෙන්නේ 25 ක් 30 ක් වෙන්න පුළුවන්. හැබැයි ළඟම තියෙන පාසැලකට ළමයි 30 දෙනෙක් වාඩි වෙලා ළමයි 20 දෙනෙක් පාස් වෙන්න පුළුවන්. ඒ තරම් හොඳ ගුරුවරු ඉන්න පුළුවන්. හැබැයි දෙමව්පියෝ ලොකු මානසික මට්ටමක් හදාගන්න පුළුවන්. ළමයා අහවල් නගරයේ පාසැලට ගිහින් දාගන්න ඕනේ කියලා. ඒ නිසා අධ්‍යාපන ඇමතිතුමාගේ විශේෂ අවධානයට යොමු කරා අපේ උපදේශක කාරක සභාවේදී ඒ මොකද බැරි වෙලාවක් මේ චක්‍ර ලේඛණ මුළු රටටම බලපාන විදිහට සකස් වෙලා තියෙන්නේ. ඒ චක්‍ර ලේඛණය අපිට ඕන විදිහට සකස් කරන්න ගියොත් මේ උද්ගත වෙන තත්ත්වයටත් අපි වගකිව යුතුයි කියන එක මතක තියා ගන්න ඕනේ කියන එක මතක් කරනවා. ඒවගේම මේ අවස්ථාවක් කර ගන්නවා ගරු සභාපතිතුමනි අර පාසැල්වල හොඳ පාසැලක් කියලා නම් වෙලා තිබෙන පාසැල වටේ තියෙන පාසැල්වල තත්ත්වය මොකද එහෙම වෙන්න හේතුව. ඒවාට ළමයි ඇතුලත් කරන්නේ නැති හේතුව මොකක්ද කියලා දෙමව්පියෝ ඒවාට හේතු හොයලා ඒවාට ඉක්මනින් පිළියම් හෙව්වා නම් මේ ප්‍රශ්නය මතු වෙන්නේ නෑ කියලා මතක් කරමින් ඔබතුමා මට අවස්ථාවක් ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මගේ වචන කීපය හමාර කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

ස්තුතියි ගරු අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමාට. මීළඟට නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*
*கௌரவ நமிந்த அனுரபிரிய* *Hon.Member Naminda Anurapriya* -----------
------------------------------------------------

ගරු සභාපතිතුමනි මං හිතන්නේ රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කලේ. මේක ප්‍රායෝගිකව සෑම ප්‍රදේශයකට ලංකාව පුරාම ඇති වුණ තත්ත්වයක්. විශේෂයෙන් මතක් කළ යුතුයි පහුගිය අපේ නව අධ්‍යාපන අමාත්‍යතුමා පත් වුණාට පස්සේ අධිකරණ තින්දුවත් එක්ක ආපු චක්‍රලේඛණය අනුව පාසැල්වල පංති කාමරවල ඉඩකඩ ප්‍රමාණය පිළිබඳව

දරුවන්ට සැහැල්ලුවෙන් ඉගෙන ගැනීමේ වාතාවරණය තියෙනවා. ඒක හොඳයි. නමුත් මේ එක පාරට ගෙනාපු ගමන් මේක ඇති වුණේ ළමයි 50 කට ආසන්න ප්‍රමාණයක් 51,55 වගේ දරුවෝ පාසැල් වලට හුරු වෙලා ඉඳලා ඒ පෝෂිත ප්‍රදේශය තුළ ඉගෙන ගත්තු දරුවන්ගේ ඒ පාසැල නොලැබීම තුළ විශාල අර්බුද ගණනාවක් පහුගිය කාලයේදී ලක් වුණා. මේකට ප්‍රධානම හේතුවක් තමයි ගරු සභාපතිතුමනි මේ ආණ්ඩු මාරු වෙන කොට ප්‍රතිපත්ති වෙනස් වෙනවා. ආණ්ඩු මාරු වෙන කොට ප්‍රතිපත්ති වෙනස්වීම තුළ එතනින් එහාට එන ගමන් මාර්ගය සම්පූර්ණයෙන්ම විකෘතිභාවයට පත් වෙනවා. මේක සෑම ආණ්ඩු පාලන කාලයක්ම ඉවර වෙලා අලුතින් ආණ්ඩුවක් ආවහම හැමදාම මේ රටේ වෙන දෙයක්. හැබැයි අපේ පළාත් සභාවේ සබරගමුව පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යතුමා ඒ ප්‍රතිපත්ති වෙනස් කරන්න ගියේ නෑ අපේ පළාත් සභාව තුළ ඉදිරියට ආපු යෝජනා ඉදිරියට කරගෙන ආවා. නමුත් රේඛීය අමාත්‍යාංශය තුළින් යම් යෝජනාවක් යම් නියෝගයක් චක්‍රලේඛණයක් එනවා නම් අපි ඒක පිළිපැදිය යුතුයි. ඒ නිසා අපි ඒක ගරු කළ යුතුයි. එක ක්‍රියාත්මක කිරීමේදී තමයි මේ අර්බුද මතු වුනේ. ඒ නිසා මේ රටේ සෑම ආණ්ඩුවකටම අපි කියලා තියෙනවා කියන්න ඕන කාරණාවක් තමයි ආණ්ඩු මාරු වුණාට ප්‍රතිපත්ති මරු කරන්න එපා කියන කාරණාව. යම් සැලැස්මක් අනුව යම් වැඩ පිළිවෙලක් රටකට නිර්මාණය කරලා ඒ වැඩ පිළිවෙලට මුදල් වෙන් කරලා ඒ අනුව යම් ආයතනයක හෝ අමාත්‍යාංශයක යම් වැඩ පිළිවෙලකට යම් සැලැස්මක් හැදුවා නම් ඒ සැලැස්ම ආණ්ඩු මාරු වෙන කොට වෙනස් වුණොත් එහෙම ආපස්සට තමයි රට යන්නේ. එහෙම තත්ත්වයක් තමයි අද උද්ගත වෙලා තියෙන්නේ. එදාත් ඒ තත්ත්වය උද්ගත වෙලා තිබුණා. ගරු සභාපතිතුමනි මේ අධ්‍යාපනය අපි ආරක්ෂා කර ගත යුතුයි. නිදහස් අධ්‍යාපනය කන්නන්ගර මැතිතුමාගේ අධ්‍යාපන ප්‍රතිපත්තිය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් වැඩි වැඩියෙන් චක්‍රලේඛණ එනවා නම් අපි කැමතියි. හැබැයි පහුගිය කාල සීමාව තුළ අපිට අහන්න ලැබුණ දේ අනුව නිදහස් අධ්‍යාපනයේ වරප්‍රසාද ගණනාවක් කප්පාදු වෙන බවට තමයි ගරු සභාපතිතුමනි මේ වෙන කොට අපිට දකින්නට අහන්නට ලැබිලා තියෙන්නේ. ඉන් එකක් තමයි පහුගිය අවුරුද්දේ පෙළ පොත් ලබාදීමේ දී පාසැල්වල. පෙළ පොතේ පිටුපස්සේ කවරයේ ලියලා තියෙනවා යම් ගාණක්. ගණිතය පොතේ මිළ රුපියල් කියලා මිළක් සඳහන් කරලා තියෙනවා. හැබැයි පෙළ පොතේ මුදල සඳහා රජය යම් මුදලක් අය කලේ නෑ, හැබැයි මුදලක් සඳහන් කරලා තියෙනවා. මම හිතනවා මෙහෙම පෙළ පොත්වල පිටුපස්සේ මුදලක් ගහලා තියෙන්නේ සමහර විට ඉදිරියේදී ඒ මිළදී අරගැනීමේ කාරණාව වෙන්න පුළුවන්. මේ නිදහස් අධ්‍යාපනය කප්පාදු වෙන වැඩ පිළිවෙලකුත් මේක තුළ ගේනවා. ඒවගේම මම දැක්කා ගිය සතියේ පුවත්පතක තියෙනවා පාසැල් නිළ ඇඳුම වෙනුවට පාට පාට ඇඳුම් ඇඳලා එන්න පුළුවන් කියලාත් අදහස් ඉදිරිපත් කරලා තියෙනවා එක එක ආකාරයක. දැන් මොකද නිළ ඇඳුම සුදු ඇඳුම දෙන්න ගියහම රජයට ලොකු මුදලක් යනවා. මොකද මේ ආණ්ඩුව වර්තමාන ආණ්ඩුව සුබසාධක පැත්ත එන්න එන්න කප්පාදු කරන්න පුළුවන්. ඒ නිසා නිළ ඇඳුම වෙනුවට පාට පාට ඇඳුම දුන්නහම ඒක ඇඳගෙන එන්න පුළුවන් ඕන කෙනෙකුට. රජයෙන් දෙන්න ඕනේ නෑ. පාසැලට ගිහිල්ලා ඉන්න පුළුවන්. මොකද උපක්‍රමශීලී වැඩක් නිදහස් අධ්‍යාපනයේ කප්පාදු කිරීම වෙනුවෙන් මේ ආණ්ඩුවේ ගෙන යන. හැබැයි එවැනි ඒවාට අපි විරුද්ධයි. මෙවැනි අදහස් යෝජනා මේ විදිහට එනවා නම් එහෙම අපි ඊට විරුද්ධව සබරගමු පළාත සූදානම් ඊට විරුද්ධව කටයුතු කරන්න කියන කාරණාව නිදහස් අධ්‍යාපනයේ ඉගෙන

ගන්නා වූ දරුවන්ට මේ සුවහසක් අහිංසක ජනතාවගේ ආදරණීය දුවා දරුවන් වෙනුවෙන් අපි මේක රැක ගත යුතුයි ඊළඟ පරපුරට ගෙනි යන්න .

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார*
*Hon.Member Ajith Kumara*
------------------------------------------------------------

පාට පාට ඇඳුම් ඇද ගෙන එන්න කියලා යෝජනාවක් නෑ. පාට පහක් නම් කරලා තියෙනවා කැමති පාටක් පාවිච්චි කරන්න පුළුවන් ඒ පාසැලට.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*
*கௌரவ நமிந்த அனுரபிரிய* *Hon.Member Naminda Anurapriya*
-----------------------------------------------------------

හරි මුට්ටිය ගහන වැඩේනේ. දැන් මෙතුමා අනුමත කරනවානේ. මම හිතන්නේ එතකොට රතු පාට අදින්න කැමති ඉස්කෝලයට රතු පාට අදින්න පුළුවන්. සුදු පාට අදින්න පුළුවන් පාසැලට සුදු පාට අදින්න පුළුවන්. කලු පාට එකට කලු පාට අදින්න පුළුවන්. කොළ පාට එකට කොළ පාට අදින්න පුළුවන්. අධ්‍යාපනයේ හොඳ ප්‍රතිසංස්කරණයක් වෙයි ඔය විදිහට යහපාලන ආණ්ඩුව විසින් මේ විදිහේ සුබසාධනය කප්පාදු කලොත් එහෙම. ඊළඟට හෙට අනිද්දා එන සබරගමු පළාත් සභාවේදී මැතිවරණය තියන්නේ නැත්නම්. ප්‍රාදේශීය සභා මැතිවරණයක් තියන්නේ නැත්නම් එසේ කටයුතු කරනවා නම් සබරගමුවේ ජනතාව සූදානම් වෙලා ඉන්නවා නිසි පිළිතුරු දෙන්න. මේවගේ යෝජනා එනවා නම් ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියලාත් අපි ඔබතුමාලාගෙන් ඉල්ලා සිටිනවා. ඉතා ඉක්මනින් මේවා කරන්න කියලා. විශේෂයෙන්ම අපි දන්නවා ගරු සභාපතිතුමනි මේ නිදහස් අධ්‍යාපනය කප්පාදුවීමේදී අපි දන්නවා මේ චක්‍රලේඛණ අලුතින් ඒම තුළ ගුරුවරයා සහ ශිෂ්‍යයා අතර තියෙන ගුරු ගරුත්වය හීන වෙලා තියෙනවා අද රටේ සහ සබරගමුවේ ගුරු ගෞරවය අද ගුරුවරයා විශේෂයෙන්ම පාසැල් අධ්‍යාපනයට වඩා පෞද්ගලිකව අධ්‍යාපනය ලාබදීම පිළිබඳව අලුතින් ඔවුන් හිතන යුගයකට ඇවිල්ලා තියෙනවා. ඒ නිසා අපි හිතනවා පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ අපේ ගරු ඇමතිතුමා සභාවේ ඉන්න වෙලාවේ අපි මතක් කර සිටිනවා අපි අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ නියාමනයක් ඇති කල යුතු කාලය ඇති වෙලා තියෙනවා. අලුත් අපේ නිදහස් අධ්‍යාපනය වරප්‍රසාද කප්පාදු කිරීම සහ ගුරු ශිෂ්‍ය ගරුත්වය හීන වීම තුළ අද ගුරුවරයා තමන්ගේ ගුරු ගරුත්වය ආරක්ෂා නොකර ගෙන පෞද්ගලික අධ්‍යාපන රටාවන් වලට උදාහරණයක් හැටියට ගත්තොත් ගරු සභාපතිතුමනි පාසැල් කාලය තුළ සිලබස් එක අපි හිතනවා දවසට පීරියඩ් දෙකක් ඉගැන්නුවොත් යම් කාලයක යම් විෂයක ඊට පස්සේ ඒ ගුරුවරයා පෞද්ගලික පංති දාලා තියෙන්නේ තව තැනක ඒ සිලබස් එකේම තවත් කොටසක් උගන්වන්න පෞද්ගලික පංති. එතකොට ඒ පෞද්ගලික පංතියට ගිහිල්ලා සල්ලි ගෙවලා ඉගෙන ගන්න පුළුවන් දෙමව්පියාගේ දරුවා ගිහිල්ලා ඒ සිලබස් එකේ ඉතුරු කොටස ඉගෙන ගන්නවා. සමහරවිට සල්ලි හාගය නැති අහිංසක දුප්පත් දෙමව්පියන්ගේ දුවා දරුවාට ඒ පෞද්ගලික පංතියට යන්න බැරි වුණොත් එහෙම ඒ දරුවාට ඒ සිලබස් එකේ විෂය දහරාව කොටසක් අධ්‍යාපනය ලබාගැනීමේ තත්ත්වය අද කැපවීමෙන් පවතින බවට අපිට තොරතුරු ලැබිලා තිබෙනවා. මේක රට තුළ. ඒක නිසා නිදහස් අධ්‍යාපනය රැක ගැනිම සඳහා මේ චක්‍රලේඛණ මොන තරම් ඉදිරිපත් කළත් මොන තරම් අධිකරණයේ බලපෑම් ඇවිල්ලා

අධිකරණයේ තීන්දු ආවත් ජනතාවට සුබවාදී විදිහට අහිංසක ජනතාවට හානියක් නොවන ආකාරයට ප්‍රතිපත්ති වෙනස් කරන්න හැබැයි ආණ්ඩු මාරු වුණාට ප්‍රතිපත්ති වෙනස් කරන්න එපා කියන කාරණාවත් අවසාන වශයෙන් මතක් කරන්න ඕනේ ගරු සභාපතිතුමනි මේ චක්‍රලේඛණ හදන කොට ජාතීන් අනුව පාසැල් වෙන් කිරීම ඉතාම වරදක්. ඒ අනුව පිරිමි පාසැල් හැටියට පාසැල් වෙන් කිරීම ඉතා වරදක්. කාන්තා පාසැල් හැටියට පාසැල් වෙන් කිරීම වරදක්. අපි ඉන්න ඕනේ ඔක්කෝම එක කණ්ඩායමක් හැටියට. මම මෑතකදී පොතක් බැලුවා ඒ පොතේ තිබුණා එකට වාසය කිරීම එකට ජීවත්වීම තුලින් වෙන සාර්ථකත්වය ඉතා වැඩියි කියලා. ගරු සභාපතිතුමනි වෙන් වෙන් කණ්ඩායම් වශයෙන් හිටියහම ඒ අයගේ ආකල්ප වෙන් වෙලා තියෙන්නේ එක තැනක. හැබැයි එකට ඉන්නවා නම් තමයි හොඳ. ඒ නිසා මිශ්‍ර පාසැල් ක්‍රමය තමයි ඉතා සාර්ථක. එතකොට පාසැල් වෙන් කිරීම තුළ තමයි පහුගිය කාලය තුළ ඇති වුණ යුද්ධ පවා ඇති වුනේ. ඒ නිසා මේ පිළිබඳවත් දැඩි අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින් රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අනුව අපේ නව එක වසර සඳහා ඉදිරිපත් කරලා තිබෙන චක්‍රලේඛණයට යම් සංශෝධන ඉදිරිපත් කරලා අපේ පළාතට අනුව ඒ සංශෝධන ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිමින් ඒ යෝජනාව කරමින් නවතිනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
--------------------------------------------------------------

ස්තූතියි ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා. මීළඟට කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*
*கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக*
*Hon.Member K.L.Ratnayake*
------------------------------------------------

ගරු සභාපතිතුමනි අපි ගරු රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට අදහස් දැක්වීමට අවස්ථාව ලබාදීම පිළිබඳව මගේ ගෞරවනීය ස්තූතිය ඔබතුමාට පිරිනමන්න ඕනේ. රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා ගෙනල්ලා තිබෙන යෝජනාව ඇත්තටම කාලෝචිත යෝජනාවක්. මගේ හිතේ අපි පහුගිය අයවැයේදීත් ඊට ඉස්සෙල්ලා අයවැයේදිත් මේ පිළිබඳව අපි කතා කළා. ඇත්තටම මධ්‍යම රජයෙන් ගෙනල්ලා තියෙන කාරණාව පංතියක ළමයි 35 ක් කිරීම සාධාරණයි. ඒකට හේතුව තමයි පහුගිය කාල වකවානුව තුළ එක පංතියක ළමයි හිටියා 50, 55 . අර කුකුළ් කූඩුවක කුකුළෝ ඉන්නවා වාගේ හිර කරලා තමයි දරුවෝ හිටියේ. මේ දරුවන්ට නිදහස තිබිය යුතුයි. ඉඩකඩ ප්‍රමාණය සීමාවක් තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මෙය දිගින් දිගටම කතා කරන කාරණාවක්. අපි මොනවා කතා කළත් මේ ක්‍රමවේදය හොඳයි. හැබැයි අවුරුද්දට එක ළමයා ගානේ අඩු කරලා එක පාරට අර 50 40 කරන්නේ නැතුව කළා නම් ඊටත් වඩා හොඳයි. රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමාත් මේ කියන්නේ ගම්වල කුඩා පාසැල්වල තියෙන බරපතල කාරණාවක් ඒවගේම නගරබද පාසැල්වලත් මේ කාරණාව තියෙනවා. ඒ නිසා අපි දිගින් දිගටම ඉල්ලීමක් කළා මේ පාසැල් නම් කරලා ඉවර වෙලා පංති වැඩ කරන්න කියන කාරණාව. හැබැයි එක වෙලාවකට මම කණගාටු වෙනවා ගරු සභාපතිතුමනි පහුගිය අයවැයේදී අපි ඉදිරිපත් කළා අධ්‍යාපන ඇමතිතුමා දන්නවා පාසැල් ගණනාවක් එක වසර පංති වැඩි කරලා දෙන්න කියලා.

ඇහැලියගොඩ ප්‍රාථමිකය, කිරිඇල්ල දේවරක්ඛිතය,ඒවගේම උඩුමත්ත විද්‍යාලය,දෙහෙරගොඩ විද්‍යාලය, කුමර විද්‍යාලය මේවගේ සියළු පාසැල් නම් කළා. ඒකෙන් පාසැල් කීපයක් අනුමත කරලා ආවා. ඒකෙන් රත්නපුර කුමර විද්‍යාලයට එක නීතියක් වුනා. මොකද ඒකෙන් කියනවා කුමර විද්‍යාලයේ එක වසර පංතිය 2017 ට අනුමත කරනවා. අනුමත කරමි කියලා . හැබැයි ගරු සභාපතිතුමනි වැඩි පාසැල් දෙහෙරගොඩ විද්‍යාලය වෙන්න පුළුවන්. ඇරැපොළ වෙන්න පුළුවන්. ගරු අධ්‍යාපන ඇමතිතුමනි ඒකෙදි ගහනවා 2017 දෙහෙරගොඩ විද්‍යාලයේ පංතිය අනුමත කරමි හැබැයි පෝෂිත කලාපයක් නම් කරනවා. හැබැයි කුමර විද්‍යාලය පෝෂිත කලාපයක් නම් කලේ නෑ. හැබැයි අර පාසැල් වලට පෝෂිත කලාපයක් නම් කලා මම දන්නේ නෑ මොකක්ද ක්‍රමවේදය කියලා . ඒ නිසා ගරු සභාපතිතුමනි අර රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා කියපු හැටියටම ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලය ගත්තහම ආසන්නම ළමයි තවත් අද ගෙවල්වල ඉන්නවා. කාරණාව වෙලා තියෙන්නෙ. ඔප්පුව නෑ. වතුර බිල නෑ. ලයිට් බිල නෑ. ඕකයි තත්ත්වය. හැබැයි ළමයි හතළිස් ගානක් එළියේ ඉන්නවා. එහෙම නම් මේ මොකක්ද තත්ත්වය. ප්‍රධාන අමාත්‍යවරයා එදා අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට මහීපාල හේරත් මැතිතුමා එදා පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය,ඔබතුමා ඇහැලියගොඩ සියළු දෙනා ඉඳලා තීන්දුවක් ගත්තා. මම කිව්වා මෙහෙම ඔප්පු නැති හින්දා වතුර බිල නැති හින්දා ලයිට් බිල නැති හින්දා මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා ඇමතිතුමා කියලා. නෑ චක්‍ර ලේඛණයට පිටින් මේ ආසන්නම ළමයි ටික ගන්න කියලා. හැබැයි එතුමා අධ්‍යාපන ඇමතිවරයා හැටියට මේ කාරණාව කිව්වා. හැබැයි විදුහල්පතිවරුන්ට ප්‍රශ්නයක් වුණා මේ චක්‍රලේඛය හින්දා මේ ළමයි ටික ඇතුලත් කර ගන්න නෑ. හැබැයි රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා කියන්නේ මේ චක්‍රලේඛණය වෙනස් කරන්න කියන කාරණාව. ඉතිං ඇත්තටම හොඳ කාරණාවක් ඒක. ඒ නිසා මේ පාසැල්වලට දරුවෝ ඇතුලත් කරන කොට විශාල ප්‍රමාණයක් එළියේ ඉන්නවා. හැබැයි කෝටිපතියාගේ ළමයාට එක නීතියක්. මධ්‍යම පංතියේ ළමයාට එක නීතියක්. දුප්පත් ළමයාට එක නීතියක්.ගරු ඇමතිතුමා. ඒක නිසා මම කියන්නේ අහිංසක දරුවාට තමයි මේක බලපාන්නේ. හැබැයි සෑම දෙමව්පියෙක්ම බලනවා තමන්ගේ දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න. හොඳ සල්ලි තියෙන මනුස්සයෙක් නම් ලක්ෂ දහය පහළොව වියදම් කරලා රෝයල් එකට දාන්න පුළුවන්. ඩීඑස් එකට දාන්න පුළුවන්. ආනන්දට නාලන්දට දාන්න පුළුවන්. හැබැයි ගමේ දළු කඩන කිරි කපන සාමාන්‍ය මනුස්සයාගේ දරුවාට ආනන්ද නාලන්ද නෙමෙයි අඩුම ගානේ ඇහැලියගොඩ ගත්තොත් ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලයට දාන්න බෑ. මේක මේ පළාත් සභා පාසැල් වලට පමණක් නෙමෙයි ජාතික පාසැල් වලටත් මේ ප්‍රශ්නය තියෙනවා. මේ ජාතික පාසැල් සංකල්පය තුළත් මේ බරපතල කාරණාව තියෙනවා. නැදුරන ඉන්න ළමයා ශිෂ්‍යත්වයෙන් පාස් වෙලා එක ලකුණක් අඩු වුණා කියලා ඇහැලියගොඩ ජාතික පාසැල දැක දැක රුවන්වැල්ල රාජසිංහට යනවා. එහෙම නම් මේ පළාත් සභාව තුළ කතා කරන කොට මේ නීති හදන කොට ,අන පනත් හදන කෙට, චක්‍ර ලේඛණ හදන කොට සීතල කාමරවල ඉඳන් හදන එක තමයි ප්‍රශ්නය තියෙන්නේ. මහ පොළොවේ පය ගහලා ඉන් මේ ගෙන්දම් පොළොවේ ඇවිදින නිළධාරී මහත්තුරු නෝනාවරු ඉන්නවා නම් ගමේ ඉන්න දරුවාගේ ගමේ ඉන්න දුප්පත් මිනිහාගේ දරුවාට පාසැල් යන්න පුළුවන්කමක් ඇති කරන්න ඕනේ. මේක තමයි ඇත්ත. ආණ්ඩු පෙරලෙන්න පුළුවන්. ආණ්ඩු වෙනස් වෙන්න පුළුවන්. ඒවා එහෙම තමයි හැමදාම ආණ්ඩු තියෙන්නේ නෑ. කොයි ආණ්ඩු

වුණත් නිවැරදි ක්‍රමවේදයක් මේකට යොදන්න ඕනේ. මේ අධ්‍යාපනය නැත්නම් රටක් හැදෙනනේ නෑ. මේ සෞඛ්‍ය නැත්නම් රටක් හැදෙන්නේ නෑ. ඒ දෙක අත්‍යාවශ්‍ය කාරණා දෙකක්. අපිට මෝඩයෝ බිහි කරන්න නම් අධ්‍යාපනය කප්පාදු කරන්න ඕනේ. ඒ නිසා මේ ක්‍රමවේදය මේ නිවාස ආධාර රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා කිව්වා යෝජනාව ගෙනාපු ගරු මන්ත්‍රීතුමා කිව්වා නිවාස ආධාර දෙන්න ගියත් රජයේ ඉඩමක් නම් ඔප්පු නැත්නම් ඒකේ නෑ. හැබැයි මේ ඔක්කෝම බලපාන්නේ දුප්පත් මිනිහාට. ඒ නිසා මේ බලපතල කාරණාවක්. ප්‍රධාන ඇමතිතුමාත් මෙතන ඉන්න තිබුණේ. අපේ විෂයභාර අමාත්‍යතුමා අධ්‍යාපන අමාත්‍යතුමා හැටියට ඔබතුමා විශේෂ අවධානය යොමු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. ඒවගේම තමයි දැන් කිරිඇල්ල දේවරක්ඛිත විද්‍යාලයේ ලබන අවුරුද්දේ එක වසරට ළමයි ඇතුලත් කර ගන්න බිල්ඩින් එකක් නෑ. ඒක ඔබතුමාගේ විශේෂ අවධානයට යොමු කරනවා. අපේ ගරු මන්ත්‍රීතුමා නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා සීට් එකේ නෑ. මම කණගාටු වෙනවා මගේ හොඳ මිත්‍රයෙක්. හැබැයි මම කැමති නෑ ද්වේශසහගතව අපි කටයුතු කරනවා නම්. දැන් පෙළ පොත්වල පිටුපස්සේ දානක් ගහලා තියෙනවාලු. සමහරවිට හොඳයි කියලා හිතෙනවා. දෙමව්පියන්ට මේක තේරෙන්නේ නෑ මේකේ වටිනාකම කීයද කියලා. ඒ ගාන ගැහුවහම දෙමව්පියෝ දන්නවා දෙයිහාමුදුරුවනේ අපි සල්ලි වලට ගත්තා නම් මෙච්චර මුදලක් යනවානේ කියලා. හැබැයි නමින්ද ගරු මන්ත්‍රීතුමා කියන්නේ මේ අධ්‍යාපනය කප්පාදු කරන්න හදනවා කියලා. එතකොට පාට වෙනස් කරන්න හදනවා කියනවා ඇඳුම්වල. හැබැයි මේ සියල්ලක් දුන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ. පොත් ටික නිකන් දුන්නා. ඇඳුම් ටික නිකන් දුන්නා. මේවගේ බරපතල කාරණාවක් තියෙනවා. හැබැයි ඕන කෙනෙකුට කියන්න පුළුවන් දේශපාලන කෝණයෙන් බලලා ආණ්ඩු වෙනස් කරන්න ආණ්ඩු පෙරලන්න, ආණ්ඩු හදන්න මේක මෙන්න මේ විදිහට අධ්‍යාපනය කප්පාදු කරනවා කියලා. ඕන මිනිහෙකුට අදහස් කියන්න පුළුවන් ගරු ඇමතිතුමා. මේ සභාවට ඕන තරම් අදහස් කියන්න පුළුවන්. හැබැයි හොද දෙයක් විතරයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා නරක දේවල් ක්‍රියාත්මක වෙන්නේ නෑ. අගමැතිතුමා කියනවා අධ්‍යාපනය දියුණු කලේ නැත්නම් රටක් ඉස්සරහට ගෙනියන්න බෑ කියලා. ඒ නිසා බරපතල කාරණාවක් තියෙන්නේ ද්වේශසහගතව ගහන්න එපා එහෙම කතා කලොත් තමුන්නාන්සේලාගේ හිත් රිදෙයි. අවුරුදු 20 ක් තිබුණා මේක කරන්න තිබුණානේ කියලා . අපි එහෙම කියන්නේ නෑ. කොච්චර කාලයක් ආණ්ඩු තිබුණට එහෙම දේවල් කරන්න බැරි වෙන අවස්ථා තියෙනවා. ඒක සාමාන්‍යයෙන් ස්වභාවය. ඒ නිසා ගරු සභාපතිතුමනි කොයි ආණ්ඩුව තිබුණත් අපි වැරදි දේ නිවැරදි කරගෙන යන්න ඕනේ. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලයේ හොඳ වැඩ කලා. මම කියන්නේ නෑ අරක කලා මේක කලා කියලා. මේ ආණ්ඩුවේත් හොඳ වැඩ ඇති. නරක වැඩත් ඇති. මේවා නිවැරදි කරගෙන ගමනක් යන්නට ඕනේ. රට හදන්න නම් විශේෂයෙන්ම පළවෙනි කාරණාව තමයි අධ්‍යාපනය දියුණු කළ යුතුයි. එදා සාමාන්‍යයෙන් 1980 වෙන කොට මේ රටේ කීදෙනාද උගත් බුද්ධිමත් මිනිස්සු හිටියේ. මේ වෙන කොට විශ්ව විද්‍යාලයට කොච්චර දරුවෝ ඇතුලත් වෙනවාද. අද ඒ ලෙවල් විභාගය කොච්චර පාස් වෙනවාද. ඕ ලෙවල් විභාගය කොච්චර පාස් වෙනවාද. පහුගිය කාලයේ මොකක්ද වුනේ. මම මේ ආණ්ඩුවක වැරැද්දක් නෙමෙයි කියන්නේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබිච්චි අඩුපාඩුකම්. ගරු සභාපතිතුමනි ඕ ලෙවල් එක පාස් නැතිනම් තරුණයා කලේ ත්‍රීවිල් එක අරගෙන හන්දියේ සමාජගත වුණා. නැතිනම් උදේ පහට ගාමන්ට් එකට ගිහිල්ලා 7.30 ට ගෙදර

එනවා. ඕන් සමාජ ක්‍රමවේදය හැදුන හැටි. ඒක නෙමෙයි හොඳ අධ්‍යාපනයක් ලබන්න ඕනේ. ඔබතුමාම කිව්වා ඔබතුමා සහ අපේ ප්‍රධාන ඇමතිතුමා කිව්වා මහාචාර්ය තුමා කියන්නේත් මම නැවත නැවත කියන්නේත් ආකල්පමීය වෙනසක් වෙන්න ඕනේ කියලා. රට අහන්න නම්. ඒක එක්සත් ජාතික පක්ෂයේ වෙන්න පුළුවන්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෙන්න පුළුවන්. පොදු විපක්ෂයේ වෙන්න පුළුවන්. සම සමාජ පක්ෂයේ වෙන්න පුළුවන්. හැබැයි මේ සමස්ත රටේ ආකල්පමීය වෙනසක් නැති වුනොත් මේ රට අදන්න බෑ කාටවත්. එක්සත් ජාතික පක්ෂය වෙන්න පුළුවන්. මේ පක්ෂ ඔක්කෝම වෙන්න පුළුවන්. ඒ නිසා ගරු සභාපතිතුමනි අපි කියනවා මේ ආකල්පමීය වෙනසත් එක්ක මේ රටේ හොඳ අධ්‍යාපනයක් ලැබිය යුතුයි. හැබැයි කිරි කපන දළු කඩන මනුස්සයාගේ දරුවාටත් හොඳ අධ්‍යාපනයක් ලබා දිය යුතුයි. ඒ අය අද විශ්ව විද්‍යාලයේ ගිහිල්ලා කිරි කපන දළු කඩන අම්මගේ තාත්තාගේ දරුවා විශ්ව විද්‍යාලයේ ගිහිල්ලා ඉහල තැන්වල ඉන්නවා. ආඩම්බරයි. එදා කෝටිපතියාගේ දරුවා පවුල්වාදයට යටත් වෙලා ඒ දරුවෝ විතරයි ඉගෙන ගත්තේ. ඉතිහාසයේ කියමනක් තියෙනවා ඔක්කෝම ඉගෙන ගත්හම පොල් ගෙඩියක් කඩා ගන්න විදිහක් නෑ. කුලී වැඩක් කර ගන්න විදිහක් නෑ කියලා මතවාදයක් තිබුණා ඉතිහාසයේ. ඒක දැන් නැති වෙලා තියෙනවා. ඒක නැති කරන්න තමයි අධ්‍යාපනය දියුණු කරලා ඉවර වෙලා ගමේ ඉන්න අහිංසක දරුවාටත් ඉගෙන ගන්න අවකාශය ලබා දිය යුතුයි කියන්නේ. ගරු රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව කාලෝචිත යෝජනාවක්. අවුරුද්දෙන් අවුරුද්ද අඩු කරන්න කියන්න. 35 ට ගෙන් එක හොඳයි හැබැයි ගරු සභාපතිතුමනි අපේ විෂයභාර ගරු ඇමතිතුමනි ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා මේ පාසැල් සඳහා එක වසර පංතිය වැඩි කරලා මේ චක්‍ර ලේඛණය ඔබතුමන්ලා මධ්‍යම රජයේ ඇමතිතුමන්ලා එක්ක කතා කරලා මේක වෙනස් කරලා මේ අහිංසක දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

ඒවගේම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා දැනට පාසැලට ඇතුලත් නොවූ දරුවෝ විශාල පිරිසක් ඉන්නවා විශේෂයෙන් ඇහැලියගොඩ ගත්තහම මට අනිත් තැන්වල සංඛ්‍යා ලේඛණ නැති නිසා. ඒක නිසා ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා කියමින් මේ ගෙනාපු යෝජනාවත් කාලෝචිත යෝජනාවක් කියමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තූතියි ගරු කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමනි. මීළඟට පිළිතුරු කතාව කිරීම සඳහා භාණු මුණිප්‍රිය මැතිතුමා.

*ගරු අමාත්‍ය භාණු මුනිප්‍රිය*
*கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய* *Hon. Minister Bhanu Munipriya* -----------
-----------------------------------------------

ගරු සභාපතිතුමනි මේ යෝජනාව එන්නේ මාස එක හමාරක් දෙකක් පහුවෙලා. ගෙනාපු කාලයත් එක්ක බලන

කොට. එම නිසා අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී පහුගිය අවස්ථාවේ යම් පෝෂක ප්‍රදේශය තුළ ජීවත් වෙන දරුවෙකුට අදාල පාසැල නොමැත්තේ නම් ඒවා ගණනය කරලා ප්‍රශ්නය විසදන්න අපි රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමා ප්‍රමුඛ අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා සමගින් අපි කමිටුවක් මේ වෙන කොට පත් කරලා තිබෙනවා. ලබන සතියේ හමුවීමට නියමිතයි. මේ කියන කාරණයේදී ඒ කියන ප්‍රශ්න විසදෙන්න පුළුවන්. ඒක ඉතා වගකීමකින් කියනවා. යම් දරුවෙක් ඉන්නවා නම් අදත් මේ සබරගමුවේ පලවෙනි ශ්‍රේණියට ඇතුලත් කර ගන්න සම්මුඛ පරීක්ෂණයේදී හෝ ඇත්ත වශයෙන්ම ඒ දරුවා එන පාසැලට සම්මුඛ පරීක්ෂණයට එනවිට එක පාසැලක් සඳහා හෝ ලකුණු අඩු වුණේ නැත්නම් ඒ සියළුම දරුවෝ ඒ පාසැලට ගන්න අදාල වන්නා වූ චක්‍ර ලේඛණ අපි ගහලා තියෙනවා ඒ අනුව ගන්න. එම නිසා අද වනවිට දරුවන් ලොකු ගණනක් 1000 කට ආසන්න ගණනක් පාසැල් යන්නේ නැතුව සබරගමුවේ ඉන්නවා කියන කාරණය ඇමතිවරයා වශයෙන් මම කිසිසේත් පිළිගන්නේ නෑ. ප්‍රශ්නය තියෙන්නේ ඇහැලියගොඩ යම් ප්‍රමාණයක් සහ ඇඹිලිපිටිය කලාපයේ එක පාසැලක් සම්බන්ධයෙන් ප්‍රශ්න තියෙනවා. ඒ සියල්ල ගත්තත් ළමයි 15 කට වැඩිය ඒ ප්‍රශ්නයට නෑ කියන එක මම කියන්නට ඕනේ. ඒ දරුවෝත් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු කැපිලා නැත්නම් අපි මේ චක්‍ර ලේඛණය පාවිච්චි කරලා නීත්‍යානුකූලව පංති වැඩි කරන්නේත් නැතුව ඒ දරුවාට අදාල පාසැල දෙනවා කියන එක මම වගකීමෙන් කියනවා. ඒ නිසා හෙට දිනයේදී මේ සබරගමුවේ දරුවෝ ඉන්නවා ඉගෙන ගන්න පාසැලක් නහැ කියලා කියනවා නම් අපි ඒක පිළිගන්නේ නෑ.

ඊළඟට ලෝකයේ ප්‍රශස්ත අධ්‍යාපනය සඳහා ලෝකයත් සමඟ ගැලපෙන අධ්‍යාපනයක් ලබාදීමේදී

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*
*கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக* Hon.Member
K.L.Ratnayake ----------
---------------------------------------

ඔප්පු නැති නිසා චක්‍රලේඛණයට අනුව ලකුණු කැපිලා තියෙනවා. ඊට පස්සේ ලයිට් බිලට වතුර බිලට කැපිලා තියෙනවා.

*ගරු අමාත්‍ය භාණු මුනිප්‍රිය*
*கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய* Hon. Minister
Bhanu Munipriya -----------
-------------------------------------------------

ඔය කියන ළමයි ඇත්තටම පදිංචි ද නැද්ද කියලා ග්‍රාම සේවක මහත්තයා වාර්තා කරනවානේ. එතකොට ඔප්පු ගැන බලන්නේ නෑ. හැබැයි වෙන පාසැලක් සඳහා ලකුණු කැපිලා නැත්නම් ප්‍රශ්නයක් නෑ. මම අහන්නේ දැන් එක පාසැලක් මෙතන තියෙනවා. තව පාසැලක් මෙතන තියෙනවා. මෙතන ඉන්න ළමයා යන කොට මේ පාසැලට ලකුණු කැපෙනවා. ඒ අය යන්න හදන්නේ අර පාසැලට නම් ඒ ළමයා ගන්නේ නෑ අපි.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*
*கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக* Hon.Member
K.L.Ratnayake ----------
---------------------------------------

කොමර්ෂල් බැංකුව පිටුපස්සේ ඉන්නේ අගුරුවාමුල්ලේ ළමයි ටික. ඒ ළමයි ටික අනිවාර්යයෙන්ම ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලයට ඇතුල් විය යුතුයි. එතකොට විදුහල්පතිතුමා කලාප කාර්යාලයටත් එවලා තියෙනවා මේ ලැයිස්තුව. එතකොට කලාප කාර්යාලයෙනුත් ගන්න කියලා කියනවා. හැබැයි විදුහල්පතිතුමා හිටපු ගමන් කියනවා උඩුමත්තටත් දාන්න කියලා. මෙන්න මේවා බරපතල කාරණා ගරු සභාපතිතුමනි.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.*
*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි භානු ඇමතිතුමනි මිනිත්තුවක් දෙන්න. ඔය ප්‍රශ්නය රත්නපුර නගරයේත් තියෙනවා. මම වෙලාවක් ඔබතුමාගෙන් ඉල්ලුවා මට වෙලාවක් ලැබුණේ නෑ. භානු ඇමතිතුමාට කරුණක් පැහැදිලි කරන්නම්. රත්නපුර නගරයේ මිහිඳු විද්‍යාලය, ධර්මපාල විද්‍යාලය,ප්‍රාථමික විද්‍යාලය, ජාතික පාසැල් විදිහට ෆර්ගසන් එක තියෙනවා. අර පැත්තෙන් ඇලෝසියෙස් එක තියෙනවා. මේ පාසැල් පහටම ලකුණු කපනවා හැම ඉස්කෝලයකටම. ඒවා හරි බරපතල කාරණා.

*ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය*
*கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய* *Hon. Minister Bhanu Munipriya* -----------
-------------------------------------------------

අවසාන වශයෙන් මේ වනවිට පාසැලක් අහිමි වෙච්ච් දරුවෝ ගැන මේ කියන්නේ. මම රත්නපුර කලාප අධ්‍යක්ෂකතුමාගෙන් ,කොට්ඨාශ අධ්‍යක්ෂකතුමාගෙන් ඇහැලියගොඩ කොට්ඨාශ අධ්‍යක්ෂකතුමාගෙන් සියළු තොරතුරු අරගෙන මේ සියල්ල ගැන කතා කරලා ඒවා ගැන දැනුමක් ඇතුව මේ කියන්නේ. අද වෙන කොට දරුවෝ 20 ක්වත් මේ ප්‍රශ්නයෙන් පෙළෙන්නේ නෑ. මම මේ කියනවා නම් නම් ලැයිස්තුව ගෙනල්ලා දෙන්න. ඔබතුමා කියන කාරණය මම පිළිගන්නවා. පාසැලට ලකුණු කැපෙන කොට ඒ අදාල පාසැල කලාපයෙන් තෝරනවා. දැන් ඇහැලියගොඩ ඒ ප්‍රශ්නය සඳහා අධ්‍යක්ෂකවරයා ගෙයින් ගෙට ගිහින් නිරීක්ෂණ කටයුතු කරනවා. මෙතන ඉන්න සමහර මන්ත්‍රීවරු දන්නවා ඇති එහෙම අපේ අධ්‍යක්ෂකතුමා වෙනම කණ්ඩායමක් හැටියට යවනවා. ඒක නිසා ඒ ප්‍රශ්නයේදී ප්‍රශ්නයක් මම නැහැ කියන්නේ නෑ . ඇහැලියගොඩ සහ ඇඹිලිපිටියේ ඒ කුඩා කණ්ඩායමක ඒක විසඳන්න මමම කමිටුවක් ඇති කළා. ඒක ඇති කලේ මහජන මන්ත්‍රීවරුත් එක්ක. අපේ අධ්‍යාපන ලේකම්තුමාත් එක්ක. කලාප අධ්‍යක්ෂකවරුත් එක්ක. ඉතිං ඒ ප්‍රශ්නයේදී ඒ බැරෑරුම් ප්‍රශ්නය අපි විසඳන්න සූදානම්. ඊළඟට මේ ලෝකයේ ප්‍රශස්ත අධ්‍යාපනයේ සඳහා වැඩ පිළිවෙලක් හැටියට තමයි දරුවෝ 35 ට අඩු කරන ක්‍රියාවලිය එන්නේ. ඒකට උදව් කරන්න ඕනේද කියලා ඇහුවොත් ඇමතිවරයා අපි මේ පළාත් සභා මන්ත්‍රීවරු විදිහට ඒකට අපි උදව් කළ යුතුයි. අපේ රටේ සමහර ප්‍රාථමික පංතිවල 55 දෙනෙක් ශිෂ්‍යයෝ හිටියා. දැන් මේක ඇවිල්ලා තියෙනවා 39 ට 35 දක්වා යන්න. හැබැයි ලෝකයේ අනිත් පාසැල්වල උගන්වන කොට ළමයි 25 ගන්නේ. ප්‍රධාන පාසැල තියෙන්නේ උපරිම ශිෂ්‍ය ප්‍රමාණය 1000 යි. අපිට එහෙම යන්න බෑ. අපි හාර දාහ ඉන්නවා. තුන්දාහ ඉන්නවා. එතකොට පසුගිය ආණ්ඩු කාලයේ

මහින්දෝදය විද්‍යාගාර එන කොට එක පහ ඒ පාසැලෙන් ඉවත් කළා. විරුද්ධ වුණා. හැබැයි ලෝකයේ වර්ග දෙකක පාසැල් කැඩිලා තියෙන්නේ. 1-5 වෙනම. එදා කවුරු විරුද්ධ වුණත් මම කිව්වා හරි ඒක 1-5 කරන්න ඕනේ කියලා. ප්‍රාථමික පාසැල්. ඊළඟට 6-13 වෙනම. මේක තමයි සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මැතිතුමාගේ මැදි විදුහල්වල 1-5 තියෙනවාලු. මම මැදි විදුහල් දෙකක ඉගෙන ගත්තා. සීවලී විද්‍යාලයේ සහ ගන්කන්ද විද්‍යාලයේ. 1-5 තිබුණේ නෑ. පසුව තමයි ඇති කලේ. අපි යන කාලයේ තිබුණේ නෑ. ආයේ ඉවත් කලා. අධ්‍යාපනය දිහා බලන්න වෙනවා. ඒවගේම මේ චක්‍රලේඛණ වලට අදාලව ගොඩනැගිලි හැදෙන්න ඕනේ. ඒක මම පිළිගන්නවා.අපි අලුත් පාසැලක් මුල් ගල් තියපු එකක් තියෙනවා. නැවත ඇති කරන්න නව නගරයේ එකඟ වෙලා තියෙනවා සක්‍රීය කරන්න. ඒ පාසැලේ අපේ සහෝදර මන්ත්‍රීවරයෙක් කිව්වා ගරු මන්ත්‍රීතුමා දෙමළ භාෂාව,ඉංග්‍රීසි භාෂාව සහ සිංහල භාෂාවෙන් ඉගන ගන්න පුළුවන් ඒ පාසැල 1-5 වෙනම ප්‍රාථමිකයක්. ඊට මෙහායින් 6-13 පාසැලක් හැටියට හදන්න. ප්‍රාථමිකයටත් ඒක ඇතුලත් වෙනවා. හැබැයි ඒක පාසැල් දෙකක්. වෙන විදුහල්පතිවරයෙක්. වෙන ක්‍රමවේදයක්. එක ළඟ ගේට්ටු දෙකක්. ඒකට දැන් මුදල් වෙන් කිරීමක් තියෙනවා. ඒක රත්නපුර. මේක හැබැයි අලුත් පාසැල් විවිධ පළාත්වල විවිධ නගරවල හැදෙන්නට අවශ්‍යයි. හොඳම පාසැල ළඟම පාසැල මුදල් නිවැරදි විදිහට පාවිච්චි කලොත් 2018 අවසාන වෙන කොට මේ ප්‍රශ්නය මේ ආකාරයෙන් අපිට බලපාන්නේ නැහැ කියන එක කියන්න අවශ්‍යයි. ඒ එක්කම ගරු සභාපතිතුමනි අ.පො.ස.සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ආවා ඒ ප්‍රතිඵල වලින් සබරගමුවේ විශිෂ්ය ගණයේ දරුවෝ සමත් වෙලා ගිය වාරයට වඩා අපි ප්‍රතිශතය ගත්තොත් 8% කට ආසන්න සමත් වෙලා ලංකාවේ නැවතත් අපි තුන් වෙනි ස්ථානයේ හිටියේ හතර , පහ ඉතිහාසයේ පළවෙනි වතාවට අපි තුන් වෙනි ස්ථානය ගත්තා. මෙවර දෙවෙනි ස්ථානයට ළං වෙලා තියෙනවා. අවසාන ප්‍රතිඵලය පළාත් සභා රැස්වීමේදී කියන්න පුළුවන්කම ලැබෙයි. ඒ දරුවන්ටත් සුභ පතමින්, රම්‍යකුමාර වීරසිංහ මැතිතුමා ගෙනාපු යෝජනාවේ සමහරක් දේවල් වලට එකඟ විය හැකි වුණත් අනිත් කාරණා වලදී එයට සමහර දේවල් වලට එකඟ විය නොහැකි බවත් එතුමා ඉන්න කමිටුවකින් ඒ සම්බන්ධයෙන් තීන්දුව ලබා දෙයි කියන විශ්වාසයෙන් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ගරු අමාත්‍යතුමා මීළඟට රංජිත් බණ්ඩාර ඇමතිතුමා.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.*
*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara*

---

ගරු ඇමතිතුමා කතා කරන්න ඉස්සෙල්ලා කතා කරන්න හිටියේ. විෂයභාර අමාත්‍යතුමා කතා කරන්න ඉස්සෙල්ලා. මම කෙටියෙන් ඔබතුමාට කියන්නේ රත්නපුර නගරයේ අපි ඉල්ලුවා ප්‍රාථමික පාසැලක්. අනිත් හැම නගරයකම ප්‍රාථමිකයක් තිබෙනවා. රත්නපුර නගරයේ විතරයි නැත්තේ. දැන් ඔබතුමා සඳහන් කළා ප්‍රාථමිකයක් ඇති කරන්න මුදල් වෙන් කළා කියලා. අපි ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. අපි අවධානයට ලක් කරනවා මුදල් හොයා ගන්න ඕනේ නම් අර රේඛීය අමාත්‍යාංශයෙන් එවපු මුදල් සමහරක් පාසැල් වැහී තිබෙන පාසැල් වලට මුදල් වෙන් වෙලා තිබෙනවා. ඒවගේම එල්ලාවල පිටකන්ද පාසැල ඒ පාසැල අපිට නම් කළ හැකියි. මේවගේ

පාසැල් ඔබතුමාට පාවිච්චියට ගන්න පුළුවන්. මේ පාසැල් ඉදිරියට පාවිච්චි කිරීම සඳහා. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරමින්. ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තූතියි ගරු අමාත්‍යතුමන්ලා දෙපළටම. යෝජනා අංක 6/1/2017/7 දරණ යෝජනාව ගරු රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන්නට යෙදුණා. ඒ පිළිබඳව ගරු සභාවේ ගරු මැති ඇමතිතුමන්ලා විසින් විවිධ අදහස් ඉදිරිපත් කරමින් යෝජනාව පිළිබඳව අදහස් දැක්වූවා. ගරු සභාව මේ යෝජනාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන්නේ රේඛීය අමාත්‍යාංශයට මේ සංශෝධන සහිතය දන්වා යවන්න කියලා. ඒ පිළිබඳව එක තීන්දුවකද ඔක්කෝම ඉන්නේ.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.*
*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි රේඛීය අමාත්‍යාංශයෙන් මේ පිළිබඳව විමසීමක් කළ යුතුයි කියන එක මම විශ්වාස කරන්නේ නෑ. මොකද හේතුව අධ්‍යාපනය විමධ්‍යගත කරපු විෂයක්. පළාත් සභාවේ විෂයක්. ඒ නිසා පළාත් සභාවේ අමාත්‍යවරයාට මේ පිළිබඳව තීන්දුවක් ගත හැකියි. සභාවේ අපි යෝජනා කරන්නේ පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යවරයාට මේ පිළිබඳව තීන්දුවක් ගන්න කියලා. රේඛීය අමාත්‍යාංශයෙන් මේ පිළිබඳව විමධ්‍යගත කරලා තියෙන්නේ. අපිට රේඛීය අමාත්‍යාංශයෙන් මේ පිළිබඳව විමසීමක් කරන්න අවශ්‍ය නැතියි කියලයි මම විශ්වාස කරන්නේ.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

පොදුවේ සියළු දෙනාම ඒ මතයද අනුමත කරන්නේ.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*
*கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*
*Hon.Member M.Y.M.Iflar*
--------------------------------------------

ගරු සභාපතිතුමනි අපේ රංජිත් බණ්ඩාර ඇමතිතුමා කියන විදිහට සමහර ඒවා ශ්‍රේෂ්ඨාධිකරණය අභියෝග කිරීම් හැකියාව අපිට නැහැ. ඒහා සමානව අධ්‍යාපනයත් ඒවගේම ගුණාත්මක භාවයක් පළාත් අමාත්‍යවරයාට සහ ලේකම්වරයාට කටයුතු කළ හැකියි. ඒවගේම අපේ උපදේශක කාරක සභාවේ මේ පිළිබඳව සාකච්ඡා කරලා සුදුසු පියවරක් ගැනීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි සභාවේ යෝජනා අදහස් ඉදිරිපත් වෙන්නේ යෝජනා වෙන කරුණු අදහස් අනුව අදාල යෝජනාවේ තීන්දු තීරණ ගැනීම සඳහා පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා වෙතත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙතත් ඒවගේම පළාත් අධ්‍යාන උපදේශක කාරක සභාව වෙතත් යොමු කරන ලෙස කරන ලද ඉල්ලීම ඒ සඳහා යැවීමට කටයුතු කරන බව මේ අවස්ථාවේදී දැනුම් දෙනවා . ඒවගේම මේ අවස්ථාවේදී සුභ පතන්න අවස්ථාවක් කර ගන්නවා අධ්‍යාපන අමාත්‍යාංශයේ සියළුම නිළධාරීතුමන්ලාට ගරු ඇමතිතුමා ඒවගේම අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ සියළුම නිළධාරීතුමන්ලාට ගරු අධ්‍යාපන අමාත්‍යතුමා ප්‍රකාශ කළ ආකාරයට පසුගිය දා සාමාන්‍ය පෙළ ප්‍රතිඵල නිකුත්වීමේදී ඉතාම ඉහළින් හා ඉතාම උසස් අන්දමින් සබරගමු පළාතේ දරුවෝ පසුගිය වසරේ තිබුණ ප්‍රතිශතයටත් වඩා උසස් අන්දමින් ජයග්‍රහනයක් ලබමින් ඉදිරියට ඇවිල්ලා අපේ පළාතට කීර්තියක් අත් කර දෙන්නට කටයුතු කලා වගේම අභිමානයක් අත් කර දෙන්නට කටයුතු කළා වගේම ඉදිරියේදී දීප්තිමත් දරුවන් සබරගමුවේ බිහි කරන්නට අවස්ථාවක් උදා කරදීම පිළිබඳව ගරු අධ්‍යාපන ඇමතිතුමාටත් ඒවගේම විශේෂයෙන් කැපවීමෙන් කටයුතු කරන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඒවගේම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යය මණ්ඩලයේ සිටින සියළුම නිළධාරී මහත්තුරුන්ට අපේ ගෞරවය ප්‍රණාමය පුද කරන්නත් මේක අවස්ථාවක් කර ගන්නවා.

මීළඟට ගරු නියෝජ්‍ය සභාපති උදයකාන්ත ගුණතිලක මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2017/9 දරණ යෝජනාව .

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*** *Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------------------------------------------

ගරු සභාපතිතුමනි ඊළඟ සභාවට ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------------

ස්තුතියි ඔබතුමාගේ ඉල්ලීම පරිදි අද ඒ යෝජනාව සාකච්ඡාවට ගැනෙන්නේ නෑ.

මීළඟට ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2017/10 දරණ යෝජනාව සඳහා අවස්ථාව.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
-----------------------------------------

ගරු සභාපතිතුමනි මෙම යෝජනා දෙකම ඊළඟට සභාවට ඇතුලත් කරන්න කටයුතු කරන්න. මොකද අද විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා සම්බන්ධීකරණ කමිටු රැස්වීමට සහභාගිවීමට සිදුවී ඇති බැවින් එතුමා මේ ස්ථානයෙන් බැහැරව ගොස් සිටිනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ඉෆ්ලාර් මැතිතුමා එතුමා මා වෙතත් ඒ බව දැනුම්දීලා තමයි මේ ස්ථානයෙන් පිට වුණේ. ඒ යෝජනා දෙකම අපි වැඩ කටයුතු කාරක සභාවට ඉදිරිපත් කරමින් ඊළඟ සභා වාරයට යෝජනා කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

මීළඟට සභාව කල් තැබීමේ යෝජනාව ගරු සභානායක තුමා.

*ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.*
*கௌரவ ஆ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
*Hon.Gov.Whip Asoka Jayawardane*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි මෙම ගරු සභාව 2017.04.25 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙස මා යෝජනා කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ගරු සභානායකතුමනි. මීළඟට සභාව කල් තබන අවස්ථාවේ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා. එතුමා සභාවේ නෑ. මීළඟට සභාව කල් තබන අවස්ථාවේ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආරියවංශ බාලසූරිය ගරු මන්ත්‍රීතුමා. එතුමාත් සභාවේ නෑ.

ඒ අනුව දැන් වෙලාව මධ්‍යාහ්න 1.56 යි. මෙම ගරු සභාවේ වැඩ කටයුතු මෙතනින් අද දිනට අවසන් වෙනවා. මෙම ගරු සභාව 2017.04.25 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා. ඔබ තමුන්නාන්සේලා සියළු දෙනාටම ප්‍රීතිමත් සුභම සුභ වාසනාවන්ත සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

අත්/කළේ :
කංචන ජයරත්න
සභාපති,
සබරගමුව පළාත් සභාව.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017 ක් වූ අප්‍රේල් මස 18 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.